ධීවර අමාත්‍යාංශය

கடற்றொழில் அமைச்சு

Ministry of Fisheries

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



2017

ලංකා ධීවර සංස්ථාව

Ceylon Fisheries Corporation

இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்

පටුන	පිටුව

- ලංකා ධීවර සංස්ථාව පිහිටුවීම හා නීතිමය වපුහය 01-02
- සාංගමික තොරතුරු 03-04
- දැක්ම හා මෙහෙවර 05
- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයාට භාර දෙන ලිපිය 06
- සභාපතිගේ සමාලෝචනය 07-08
- අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 09-12
- විගණකාධිපතිගේ වාර්තාව 13-23
- විගණකාධිපති වාර්තාවට අදාල පිළිතුරු ලිපිය 24-29
- මූල්‍ය තත්ව ප්‍රකාශය 30
- විස්තීර්ණ ආදායම් ප්‍රකාශය 31
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය 32
- ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 33
- ගිණුම් සටහන් 34
- වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය 35-43
- අනුපාත විශ්ලේෂණය 44
- සේවක විස්තර වාර්තාව 45

ලංකා ධීවර සංස්ථාව පිහිටුවීම හා නීතිමය ව්‍යුහය

1957 අංක 49 දරණ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වසරේදී ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කරන ලද අතර ව්‍යාපාරික කටයුතු 1965 වසරේදී ආරම්භ කොට ඇත. මූලාරම්භයේදී සංස්ථා අරමුණු වලින් මුළු මහත් ධීවර ක්ෂේත්‍රයම ආවරණය විය. පහත සඳහන් කර ඇති ලංකා ධීවර සංස්ථාවේ අරමුණු 1964.10.01 දිනැති හා අංක 14186 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන්ව ඇත.

1. නීතිගත සංස්ථාව මඟින් කෙලින්ම හා බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් ගැඹුරු මුහුදේ ට්‍රෝලර් යාත්‍රා මඟින් මසුන් ඇල්ලීම.

11. සංස්ථාව විසින් කෙලින්ම හෝ බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් මසුන් සකස් කිරීම. ටින් කිරීම, වේලීම හා සකස් කිරීම. මසුන් අතුරු නිෂ්පාදන කටයුතු.

111. සංස්ථාව විසින් කෙලින්ම හෝ බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් මසුන් තොග වශයෙන් හෝ සිල්ලරට අලෙවි කිරීම හා බෙදාහැරීම.

iv. ශීතාගාර ඇතළු ධීවර වරායන් හා නැංගුරම් පොලවල් ඉදිකිරීම් නඩත්තු කිරීම.

v. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන් ආනයනය කිරීම හා අපනයනය කිරීම.

vi. ධීවර කර්මාන්තය සඳහා ආම්පන්න උපකරණ හා වෙනත් අවශ්‍යපෝකරණ ආනයනය කිරීම හා විකිණීම'

vii. ධීවර දෙපාර්තමේන්තුව හෝ රජයේ වෙනයම් දෙපාර්තමේන්තුවක් වෙනුවෙන් ධීවර කර්මාන්තය සංවර්ධනයට අදාල කටයුතු වල නියැලීම.

viii. ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු හා වෙනත් කුඩා යාත්‍රා තැනීම.

ix. ධීවර බෝට්ටු අළුත්වැඩියාව කිරීමේ හා නඩත්තු කිරීමේ පහසුකම් සැපයීම'

x. ධීවර අවශ්‍යෙපකරණ නිපදවීම හා විකිණීම.

මෙම අරමුණු වලින් සමහරක් දැනට අහෝසි වී ඇති බව සඳහන් කළ යුතුය. නමුදු ඉහත සඳහන් ගැසට් පත්‍රයේ සඳහන් wxl (v) දරණ අරමුණු 2011.06.30 දිනැති හා අංක 1712/21 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධනය කරමින් පහත සඳහන් අරමුණු ආදේශ කිරීමට කටයුතු කර ඇත.

1. ස්වසම්පත් කලාපය සහ පිළිගත් ජාත්‍යන්තර රීතිවලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල නිරත වීම.

11. මත්ස්‍ය පිරිසැකසුම් පහසුකම් සැලසීම.

111. දේශීය සහ විදේශීය වෙළඳපොල මසුන් විකිණීම.

iv. අවශ්‍ය යැයි හැඟියන අවස්ථාවන්හිදී මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම.

v. ඉහත සඳහන් කටයුතුවලින් යම් කටයුත්තක් සිදු කිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයන් සමඟ හවුල් ව්‍යාපාර ගිවිසුම්වලට ඇතුල්වීම.

vi. දේශීය සහ විදේශීය නිෂ්පාදකයා හා බෙදාහරින්නන් නියෝජනය.

ඉහත සංශෝධිත අරමුණු 06න්ද වර්තමානයේදී ලංකා ධීවර සංස්ථාවේ ප්‍රාථමික ව්‍යාපාර ක්‍රියාකාරකම් 04ක් ක්‍රියාකාරී ලෙස සිදු කරගෙන යනු ලබයි.

1. සංස්ථා අලෙවිසැල් හරහා මත්ස්‍ය වෙළඳාම.
2. ඇසුරුම් කරන ලද අධිශීත මසුන් අලෙවිය.
3. දිවයින පුරා ව්‍යාපාර පහසුකම් පුළුල් කර මත්ස්‍ය අලෙවිය වර්ධනය කිරීම.
4. අයිස් සැපයුම හා ශීත ගබඩා පහසුකම් සැපයීමට කටයුතු කිරීම.

සාංගමික තොරතරු

සංස්ථාවේ නම	-	ලංකා ධීවර සංස්ථාව
නෛතික ස්වභාවය	-	රාජ්‍ය සංස්ථාව
සංස්ථාපනය කරන ලද දිනය	-	1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 ඔක්තෝබර් 01 වන දින

අධ්‍යක්ෂකවරුන් -

බී.කේ.ජගත් කුමාර පෙරේරා මහතා	-	සභාපති
පී.ඒ.සිරිනිමල් පෙරේරා	-	කළමනාකාර අධ්‍යක්ෂක
එච්.ජී.සුමනසිංහ මහතා	-	අධ්‍යක්ෂ මහා භාණ්ඩාගාර නියෝජිත
ජී.අශෝක විජේරත්න මහතා	-	අධ්‍යක්ෂ
එන්.පී.කේ.රණවීර මහතා	-	අධ්‍යක්ෂ
සුනිල් එදිරිසූරිය මහතා	-	අධ්‍යක්ෂ

ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය

නිලාන් ක්‍රිශාන්ත මිරැන්ඩා මහතා	-	සාමාන්‍යාධිකාරී
දහම්කිත් පුස්සැල්ල මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල්
දුමින්ද රුවන් මුණසිංහ මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි
යූ.ජනක පාලින්ද සේනාරත්න මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන හා පරිපාලන)
ඩී.සී.කරුණාතිලක මහතා	-	අභ්‍යන්තර විගණන නිලධාරී
කේ.වී.එච්.බණ්ඩාරනායක මහත්මිය	-	නීති නිලධාරිණී / අධ්‍යක්ෂ මණ්ඩල ලේඛම්

ලියාපදිංචි කාර්යාලය	-	නො.15, රොක් හවුස් පටුමග, කොළඹ 15
විගණකවරුන්	-	විගණකාධිපති
බැංකු කරුවන්	-	ලංකා බැංකුව
		මහජන බැංකුව

දැක්ම

ධීවර නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ සුභසිද්ධිය උදෙසා ධීවර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන කිරීම සහ මග පෙන්වීමේ ප්‍රමුඛතම වාණිජමය ආයතනය බවට පත්වීම.

මෙහෙවර

- **ඵලදායී සංවිධානයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබා දීම**.

- **මසුන් නිෂ්පාදනය, සැකසුම් කිරීම හා අලෙවි කිරීම සඳහා වගකීමෙන් හා සැලකීමෙන් යුක්ත අර්ථාන්විත ආයතනයක් වීම**.

- **ධීවර කාර්මිකයාගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබා ගැනීම.**

- **නවීන තාක්ෂණය යොදා ගනිමින් සාධාරණ මිලකට උසස් තත්වයෙන් යුත් මසුන් සහ වටිනාකම එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතු වල හා අලෙවි කටයුතු වල නිරත වීම.**

- **පාරිභෝගිකයාගේ ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් වැඩි දායකත්වයක් ලබා දීමට කටයුතු කිරීම.**

ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත භාරදෙන ලද ලිපිය

රොක් හවුස් පටුමග,
මෝදර, කොළඹ 15.
2023.08.08

ගරු ඩග්ලස් දේවානන්ද මැතිතුමා
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නව මහලේකම් කාර්යාලය, මාළිඟාවත්ත,
කොළඹ - 10

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (ඈ) වගන්තිය සහ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව මා විසින් 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ධීවර සංස්ථාව් වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

1. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2. 2017 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

3. 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

4. 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපතිගේ වාර්තාව.

5. විගණකාධිපති වාර්තාව සඳහා ලංකා ධීවර සංස්ථාව විසින් සපයන ලද පිළිතුර

මෙම වාර්තාව ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී වූ,



ඩී.වී.උපුල්
සභාපති
ලංකා ධීවර සංස්ථාව

සභාපතිගේ සමාලෝචනය

ලංකා රජයේ පූර්ණ අධීක්ෂණය හා මග පෙන්වීම ලබන මසුන් අලෙවියේ නිරත ප්‍රමුඛතම හා එකම රාජ්‍ය ආයතනය වනුයේ ලංකා ධීවර සංස්ථාවයි. ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීමට දායකත්වය ලබා දෙමින්, පාරිභෝගික ජනතාව වෙත සාධාරණ මිලට මසුන් ලබා ගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම ලංකා ධීවර සංස්ථාවේ මුඛ්‍ය පරමාර්ථය වේ. සමාජයේ සෑම ජන කොටසකටම සිය ආදායම් මට්ටම අනුව මසුන් මිලදී ගැනීමේ පහසුකම් සලසාදීම, ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීමත් මඟින් ජීවන වියදම පහත දැමීමත් සෞඛ්‍යසම්පන්න වූ කුටුම්භයක් ඇති කිරීම සඳහා මසුන් අලෙවියේ සංස්ථාවට අයත් වෙළඳපොල කොටස වැඩිකර ගැනීමේ අවශ්‍යතාවය සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

මසුන් අලෙවියේ නිරත රාජ්‍ය ආයතනය ලෙස ලංකා ධීවර සංස්ථාවට සුවිශේෂී කාර්යභාරයක් පැවරී ඇත. එමෙන්ම මසුන් අලෙවිය විවෘත වෙළඳපොල තරඟකාරිත්වය මත තීරණය වන්නක් බැවින් සංස්ථාව විසින් කළමනාකරණ උපාය මාර්ග වන මිල ප්‍රතිපත්තිය, භාණ්ඩ (මසුන් වර්ග) ප්‍රභේදයන්, වෙළඳපොල විවිධාංගීකරණය, අලෙවි ප්‍රවර්ධනය යනාදී කළමනාකරණ උපායමාර්ග තරඟකාරී වෙළඳපොල ජයග්‍රහණය කර ගැනීම සඳහා සාර්ථකව දියත් කොට ඇත.

1 මසුන් මිලදී ගැනීම හා අලෙවිය

ධීවර ප්‍රජාවගේ මසුන් අස්වැන්න සෘජුවම සංස්ථාවට මිලදී ගත හැකිනම් වඩා හොඳ මිලක් ඔවුන්ට ලබා දීමට හැකියාව ඇත. එමෙන්ම ඒ තුලින් පාරිභෝගිකයා වෙත තත්වයෙන් උසස් මසුන් අඩුමිලට ලබා දීමට හැකිවනු ඇත. මෙය සංස්ථාවේ දියුණුවටද සෘජු බලපෑමක් වේ. යාපනය, පේසාලේ , පේදුරු තුඩුව සහ ත්‍රීකුණාමලය යන ප්‍රදේශවල මසුන් අස්වැන්න මිලදී ගැනීමේ වැඩ පිළිවෙල ව්‍යාප්ත කිරීම හා එම ප්‍රදේශවල වෙසෙන ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම උදෙසා ධීවර ගම්මානවලට ගොස් ධීවර ප්‍රජාව හමුවී සාකච්ඡා පවත්වා සාර්ථක ක්‍රියාමාර්ග ගන්නා ලදී. එමෙන්ම වර්ෂය තුලදී නව මිලදී ගැනුම් මධ්‍යස්ථාන ස්ථාපිත කොට සංස්ථාවේ මසුන් මිලදී ගැනීම වැඩි කර ගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව 2017 වර්ෂය තුලදී මෙ.ටො. 3445ක මසුන් තොගයක් සංස්ථාව මිලදී ගන්නා ලදී.

2017 වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාව මසුන් මෙ.ටො.3907ක් සිය අලෙවිසැල් ජාලය ජංගම රිය අලෙවි ව්‍යාපෘතිය, ලංකා සතොස හා කෝප් සිටි අලෙවිසැල් සහ රජයේ රෝහල් මසුන් සැපයීම තුලින් අලෙවි කර ගැනීමට හැකියාව ලැබුණි.

2. <u>අයිස් නිෂ්පාදනය හා අලෙවිය</u>

ලංකා ධිවර සංස්ථාවේ තවත් එක් ආදායම් උත්පාදන අංශයක් ලෙස අයිස් නිෂ්පාදනය හා අලෙවිය අනුරාධපුරය, ගාල්ල , හම්බන්තොට සහ මිරිස්ස අයිස් යන්ත්‍රාගාරවල නිෂ්පාදනය තුලින් මෙ.ටො.9843 ක අලෙවිය ළඟා කර ගැනීමට හැකිවිය.

3. <u>මසුන් ටින් කිරීමේ ව්‍යාපෘතිය</u>

ලංකා ධීවර සංස්ථාව විසින් දිගුකාලීන කුලී පදනම මත ගාල්ල ධීවර සංස්ථා පරිශ්‍රය හැෂිකුක් ලංකා පෞද්ගලික සමාගම වෙත මසුන් ටින් කිරීමේ කර්මාන්ත ශාලාවක් සඳහා ලබා දී ඇත.

සේවාවන්

4. **ශීතාගාර පහසුකම් සහ සැකසුම් පහසුකම් සැලසීම.**

මෝදර පිහිටා ඇති ශීතාගාර සංකීර්ණය ලංකා ධීවර සංස්ථා අලෙවි ජාලයේ ප්‍රධාන උපාංගයකි. එහි ගබඩා කිරීම අධිශීත කිරීම සහ ධීවර සංස්ථාවේ භාහිර හා විධායක වලට සැකසුම් පහසුකම් සැපයීම සිදු කරයි. මෙම ප්‍රශස්ථ තොග පවත්වාගෙන යාම තුලින් පාරිභෝගිකයන්ට වඩා හොඳ සේවයක් සැපයීමට හැකිවී ඇත.

5. **<u>සංචාරක බංගලා පහසුකම්</u>**

නුවරඑළිය, කළමැටිය, සිංහපුර හා මින්නේරිය යන නගරයන්හි පිහිටි සංස්ථාවට අයත් නවීන පහසුකම් වලින් සමන්විත සංචාරක බංගලා තුලින් ආකර්ෂණීය හා පළපුරුදු කාර්ය මණ්ඩලයක සේවය මහජනතාව වෙත ලබා දීමට පියවර ගෙන ඇත.

6. **<u>ලාභාලාභ</u>**

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතුවලින් රුමිලියන 2.21ක ශුද්ධ ලාභයක් වාර්තා වී ඇත. පසුගිය වර්ෂයේ ලාභය රුමිලියන 247.81කි.

ඩී.වී.උපුල්
සභාපති
ලංකා ධීවර සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

- 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එම කාල සීමාව සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයද සමඟ ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා සතුටින් ඉදිරිපත් කර සිටී.

- ලංකා ධීවර සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී පිහිටුවන ලදී.

- ලංකා ධීවර සංස්ථාව ධිවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවත්නා අතර සංස්ථාව විසින් 2017 වර්ෂය තුලදී කරගෙන යනු ලැබූ කටයුතු පහත ආකාරයට සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- දේශීය වශයෙන් මසුන් මිලදී ගැනීම.
- තොග සහ සිල්ලර පදනම මත මසුන් අලෙවි කිරීම.
- අයිස් නිෂ්පාදනය සහ අලෙවිය.
- ශීතාගාර පහසුකම් සැපයීම

ව්‍යාපාරික කටයුතු සමාලෝචනය

- සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් සභාපතිගේ සමාලෝචනය මෙම අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ වැදගත් කොටසක් ලෙස සැලකිය යුතුවේ.


මූල්‍ය ව්‍යුහය

- පසුගිය වර්ෂ කිහිපය තුල සංස්ථාවේ සමස්ථ ආදායම රුබිලියන දෙකකට වැඩි වටිනාකමක් වූ නමුදු 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී මෙහෙයුම් ආදායම රුමිලියන 608.3න් හා මෙහෙයුම් නොවන අනිකුත් ආදායමද රුමිලියන 665.8න් අඩුවීමක් දක්නට ලැබේ. මේ සඳහා ප්‍රධාන කාර්යාලයේ පැවති ශීතාගර සංකීර්ණය හා සැකසුම් ඒකකය අක්‍රීය වීමත් සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයේ මත්ස්‍ය හිඟයත් මේ සඳහා බලපාන ලදී.

- සමස්ථ ශුද්ධ ලාභාලාභ සැලකිල්ලට ගැනීමේදී 2013,2014,2015,2016 හා 2017 වර්ෂ සැලකිය යුතු පිළිවෙලින් රුමිලියන 54.45, 119.19,259.9, 247 ක් හා සමාලෝචිත වර්ෂයේ (2017) රුමිලියන 2.2ක ශුද්ධ ලාභයක් පෙන්නුම් කරයි.

සමස්ථ ආදායම හා ලාභ/අලාභ විස්තරය

	සමස්ථ ආදායම රු.මි.	දළ ලාභය රු.මි.	ශුද්ධ ලාභ/අලාභ රු.මි.
2011	1977	605.17	-68.97
2012	2079	701.19	-41.76
2013	1940	657.36	-54.45
2014	1855	563.26	-119.18
2015	1783	428.97	-259.90
2016	2736	445.13	247.80
2017	2127	503.16	2



❖ කාර්ය මණ්ඩලය

➢ විධායක නිලධාරීන්	-	42
➢ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි	-	211
➢ තාක්ෂණික නිලධාරීන්	-	138
➢ කණිෂ්ඨ සේවකයින්	-	321
		712

❖ විනය ක්‍රියාමාර්ග

➢ නැවත සේවයේ පිහිටුවීම් සංඛ්‍යාව	-	04
➢ වැඩ තහනම් කිරීම්	-	06

❖ විධායක තනතුරු සඳහා බඳවා ගැනීම්

➢ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන)	-	01
➢ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි	-	01
➢ යාන්ත්‍රික ඉංජිනේරු	-	01
➢ තාක්ෂණික නිලධාරී	-	01

විධායක තනතුරේ සේවයෙන් ඉවත්වීම්

➢ නැත

❖ ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

- ලංකා ධීවර සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලට අදාල කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු බැඳීමක් නොමැත.

ස්තූති කිරීම.

- සංස්ථාවේ වර්ධකය සහ සාර්ථකත්වය උදෙසා ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමන් විසින් ලබා දෙන ලද සියළු වටිනා උපදෙස්, සහයෝගය හා මඟපෙන්වීම් පිළිබඳව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්තූතිය පලකර සිටී. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියළුම නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෘදයාංගමව අගය කර සිටී. මෙම වර්ෂය තුලදී අප වෙත ලබාදෙන ලද සහයෝගය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ සියළු නිලධාරීන් හට අපගේ ස්තූතිය පළ කර සිටිමු .

- අපගේ වටිනා සම්පත වනුයේ සමස්ථ සේවක පිරිස වන අතර වර්ෂය තුලදී ඔවුන් ලබාදුන් සේවය සහ සහයෝගය පිළිබඳව සමස්ථ කාර්ය මණ්ඩලය වෙත අපගේ ස්තූතිය පළකර සිටිමු.

- අපගේ වටිනා පාරිභෝගිකයන් වෙතද රාජ්‍ය ආයතන වෙතද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම ස්තූතිය ප්‍රකාශ කර සිටින අතර ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් නිරන්තරයෙන් දක්වන ලද ඔවුන්ගේ සහයෝගය සහ අප කෙරෙහි දක්වන ලද විශ්වාසය පිළිබඳව ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත විශේෂ ස්තූතිය පළ කර සිටිමු.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එෆ්එල්එස්/ඒ/සිඑෆ්සී/1/
එෆ්ඒ/2021/11

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ඔක්තෝබර් 10 දින



1077

3.30pm.

සභාපති,
ලංකා ගිවර සංස්ථාව.

ලංකා ගිවර සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - ගිවර අමාත්‍යාංශය.
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එෆ්එල්එස්/ඒ/සිඑෆ්සී/1/එෆ්ඒ/2021

මගේ අංකය
உமது இல.
Your No..

දිනය
திகதி
Date 2022 ඔක්තෝබර් 10 දින

සභාපති,
ලංකා ධීවර සංස්ථාව.

ලංකා ධීවර සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ලංකා ධීවර සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අද්භස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 39 වගන්තිය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනයකදී ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇති වුවහොත් එම අතිරික්තය අදාළ කාල පරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම හා ප්‍රත්‍යාගණන සංචිතයට ගැළපීම සිදු කල යුතු වුවත් 2014 වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනයෙන් ඇති වූ ප්‍රත්‍යාගණන සංචිතයෙන් රු.45,328,629 ක් 2017 වර්ෂයේ ආදායමට මාරු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ ප්‍රත්‍යාගණන සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා

තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් ලාභදායීත්වයක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය විය.

ආ) ප්‍රතිපාදන හා අසම්භාව්‍ය බැරකම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ 37 ඡේද අංක 86 අනුව හෙළිදරව් කිරීම් සිදුකල යුතු වුවද රු.7,762,902 ක අසම්භාව්‍ය වගකීම් සඳහා අදාළ හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) භාණ්ඩාගාරය විසින් 2014 වර්ෂයේදී සංස්ථාව වෙත පවරා දෙනු ලැබූ රු.237,169,566 ක් වටිනා බැඳුම්කර ප්‍රාග්ධන අයිතමයක් ලෙස සලකා 2017 වර්ෂයේ සිට මේ දක්වා ප්‍රාග්ධන ක්‍රමක්ෂය ලෙස ලියාහැර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාලව රු.47,433,913 ක් ලියා හැර තිබුන අතර මේ හේතුවෙන් ආයතනයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි.

ආ) සමාලෝචිත වර්ෂයේදී වෙළඳ ණයගැතියන් සඳහා බොල් හා අඩමාණ ණය සඳහා වෙන්කිරීම් සිදු කර නොතිබූ අතර සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේද නිසිපරිදි ඒ පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) 2016 වර්ෂයේ ලද රාජ්‍ය ප්‍රදාන රු.865,733,754 කින් , පිළිවෙලින් දීර්ඝකාලීන ණය නිදහස් කිරීම සඳහා වැය කර තිබූ රු. 225,613,104 ක් සහ 2015 වර්ෂයේ උපචිත වියදම් පියවීම සඳහා වැය කර තිබූ රු. 130,154,441 ක්ද මසුන් සැපයුම්කරුවන්ට ගෙවීමට වැය කළ රු. 19,867,583 ක් ලෙස මුලු වටිනාකම රු. 375,635,128 ක් 2016 වර්ෂයේ ආදායමට ලියාහැර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ පූර්ව වර්ෂ ගැලපුම් නොකිරීම හේතුවෙන් සමුච්චිත අලාභයරු.375,635,128 කින් අඩු වී තිබුණි.

ආ) සමාලෝචිත වර්ෂය තුළදී ඉවත්කර තිබුණු රු.600,000 ක් වටිනා 227 - 6264 දරණ රථයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ශේෂයෙන් වැඩියෙන්ද සමුච්චිත ක්ෂය රු.360,000 ක් වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමානයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

ඇ) ලංකා ධීවර සංස්ථාවේ විධායකයන් විසින් මත්ස්‍යයන් අලෙවි කිරීමට කුලී පදනම මත ලබාගනු ලබන වෙළඳ කුටි මත්ස්‍යයන් අලෙවි කිරීමට සුදුසු පරිදි සකස් කිරීම සඳහා දරනු ලබන වියදම්කොටස් කර වර්ෂයන් කිහිපයකදී වියදමට ගැළපීම් සිදු කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.13,933,437 ක් වූ වියදමින් රු.8,998,617 ක්ද පෙර වර්ෂයන්ට අදාලව රු.8,309,094 ක්ද වියදමට ගලපා තිබුණද අදාල කුලි ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවූ බැවින් කුලි කාලයට අදාලව වියදම නිවැරදිව ගලපා තිබේද යන්න තහවුරු කර ගත නොහැකි විය.

ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන වලට අදාළ වත්කම් වල ජීවකාලය මත පදනම්ව ක්‍රමක්ෂය ගණනය කිරීම වෙනුවට එම ප්‍රාග්ධන ප්‍රදාන ලෙජර් ශේෂ සහ උපලේඛණ ශේෂ අතර වෙනස මත පදනම්ව ක්‍රමක්ෂය ගණනය කිරීමෙන් රු.28,553,054 කින් ක්‍රමක්ෂය ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

ඉ) ටූනා ව්‍යාපෘතියේ පාඩු පියවීම සඳහා පූර්ව වර්ෂ වල සංස්ථාවට ලැබී තිබූ රු.5,510,615 ක් සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය ආදායමට හඳුනා ගැනීම නිසා එම ප්‍රමාණයෙන් ක්‍රමක්ෂය ආදායම් වැඩි වී තිබුණි.

ඊ) විධායක අතර ජංගම ගිණුම් සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට රු.21,557,777 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම ශේෂය අවිනිශ්චිත ගිණුමට මාරු කිරීම හැර විගණිත දින වන තෙක්ම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

උ) ලැබිය යුතු මුළු ආපදා ණය ශේෂය වශයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල රු.4,662,849ක් දැක්වුවද සේවක ආපදා ණය ලේඛණය අනුව මුළු ණය ශේෂය රු.3,961,109 ක් විය. ඒ අනුව රු.701,740 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

මුදල් ප්‍රවාහ ප්‍රකාශ සැකසීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) ආරම්භක ශේෂයක් ලෙස තිබූ පෙර වර්ෂ සඳහා ගෙවිය යුතු හිඟ අර්ථසාධක අරමුදල් රු.175,550,922ක් බදු පෙර ලාභයට ගැලපුම්කර නොතිබුනද මෙහෙයුම් බදු පෙර ලාභයෙන් අඩුකර තිබීමෙන් එම වටිනාකමින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය අඩු වී තිබුණි.

ආ) සමාලෝචිත වර්ෂයේ සත්‍ය වශයෙන් ගෙවා තිබූ පාරිතෝෂික මුදල රු.6,652,215 ක් වුවද ගෙවන ලද පාරිතෝෂික මුදල ලෙස රු.47,520,955ක් මෙහෙයුම් මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි.

ඇ) සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත උපකරණ මිලදීගැනීම් රු.18,226,001 ක් වුවද ආයෝජන ක්‍රියාකාරකම් යටතේ රු.16,483,851 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,742,150 කින් ආයෝජන ක්‍රියාකාරකම් අඩුවෙන් දක්වා තිබුණි.

ඈ) සමාලෝචිත වර්ෂයේ වාහන හා අබලි වාහන විකුණුම් ආදායම රු.5,930,777ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් ලෙස රු.3,057,850 ක් හඳුනාගෙන තිබුණි.තවද වාහන හා අබලි වාහන විකිණීමෙන් වූ රු.3,590,777 ක ශුද්ධ ලාභය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ බදු පෙර ලාභයෙන් අඩු කර නොතිබුණි.

2.2.5 විගණනයට ලිඛිත සාක්ෂි නොවීම

අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ලංකා ධීවර සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය සඳහා රු.1,248,265,895ක වටිනාකමක් සහිත ජර්නල් සටහන් 516 ක් ඉදිරිපත් කර තිබුණු අතර එම ජර්නල් සටහන් සඳහා අවශ්‍ය ජර්නල් වවුචර්, සහයක ලිපිගොනු, අනුමැතියන් කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් නොවූ අතර හානි ප්‍රතිපූර්ණය ලෙස මූල්‍ය ප්‍රකාශ තුල දක්වා තිබූ රු.143,403,352 ක වටිනාකම් සඳහා ද හානි ප්‍රතිපූර්ණ ගිණුමක් ඇති කල ආකාරයට අදාල ජර්නල් සටහන් හා මූලාශ්‍ර ලියවිලි ද ඉදිරිපත් කර නොතිබුණි.

ආ) වටිනාකම රු.157,671,728 ක්වූ වසර 02 කට වැඩි කාලයක සිට පැවත එන ණයහිමි ශේෂ වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ණයහිමි ශේෂ සනාථන,ගිවිසුම්, ඉන්වොයිසි ආදී මූලාශ්‍ර ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ඇ) 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය සිදු කිරීමේදී රු.3,725,000 ක වටිනාකමකට අගය කරන ලද යන්ත්‍ර (Fork Lift) 4 ක වටිනාකමට අදාල උපලේඛණයක් ඉදිරිපත් කර නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ස්ථාවර වත්කම් යටතේ සහ ක්ෂය යටතේ එම යන්ත්‍රගළපා තිබේද යන්න තහවුරු කර ගත නොහැකි විය.

ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ලංකා ධීවර සංස්ථාවේ විධායකයන්(Region) අතර මත්ස්‍යයන් මිලදී ගැනීම සහ විකිණීම අතර රු.845,319 ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනසට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති වෙළඳ ලැබිය යුතු දෑ රු.234,326,842 ක් අතරින් වර්ෂ 10 ට වැඩි ණයගැතියන් රු.13,912,440 ක්ද වසර 5 ට වැඩි ණයගැතියන් රු.67,401,315 ක්ද වසර 3 ට වැඩි ණයගැතියන් 11,865,552 ක්ද, රාජ්‍ය සැපයුම් අංශයේ වෙනත් ණය ලෙස දක්වා තිබුරු.939,938 ක රෝහල් සඳහා ආදේශක සැපයීම වෙනුවෙන් වන මුදලද මේ දක්වා අයකර ගෙන නොතිබුණි.මෙම ණයගැති ශේෂසඳහා ශේෂ සනාථන ලැබී නොතිබුණු අතර අඩමාණ ණය සඳහා වෙන් කිරීමද සිදුකර නොතිබූ අතර මෙම ශේෂ අයකර ගැනීම ද අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

ආ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පැවති වෙනත් ලැබිය යුතු රු.63,382,714 ක ණය ශේෂ අතරින් රු.52,689,374 ක් වන සියයට 83 ක් වර්ෂ 5 ක් ඉක්මවා තිබූ අතර රු.4,367,117 ක් හෙවත් සියයට 7 ක් වර්ෂ 2 ට වැඩි ශේෂයන් විය. මෙම ශේෂ සඳහා ශේෂසනාථන ලැබී නොතිබුණු අතර අඩමාණ ණය සඳහා වෙන්කිරීමද සිදු කර නොතිබූ අතර මෙම ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපාදනය කර වර්ෂ 2 ක්ද ඉක්මවා තිබූ ජාතිය ගොඩනැගීමේ (NBT) රු.48,146,752 ක බදු මුදල 2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 04 වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

ඇ) 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක් ඉක්මවා තිබූ රු. 25,007,632 ක ආර්ථික සේවා බදු මුදල් (ESC) 2013 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීතිරීති විධානයට යොමුව	විස්තරය
අ) මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව	2017 වර්ෂයේ සංස්ථාවේ බැංකු ගිණුම් අංක 3562ටඅදාලව ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.143,283 ක් වූ 2015, 2016 හා 2017 වර්ෂ වලට අදාල වූ චෙක්පත් 04 ක් සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.
ආ) 2013 සැප්තැම්බර් 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2013 හි 3.9 ඡේදය ප්‍රකාරව	සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල්, සේවක භාරකාර අරමුදල් සඳහා වන දායක මුදල් නිසි පරිදි කලට වේලාවට සිදුකරන බවටත් වැටුප් ගෙවීමට සමාන ප්‍රමුඛතාවයකින් යුතුව ඒ හා සමගාමීව අදාල මූලණයන් සිදුකරන බවටත් හිඟ දායක මුදල් වර්ධනය නොවන බවටත් ආයතන වල සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරීන්ද, විෂය භාර නිලධාරීන්ද තනි තනිවත්, සාමූහිකවත් වගකීමට බැඳෙන නමුත් 2006 වර්ෂයේ සිට 2016 මැයි මස දක්වා රු.170,216,102 ක දායක මුදල් හිඟව පැවතුණි.
ඇ) 2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව	විකුණුම් මත ගණනය කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද වෙනම ගිණුම් ගත කර දේශීය ආදායම් දෙපාර්තමේනතුවට ප්‍රේෂණය කල යුතු වුවත් රු. 2,127,438,604 ක්වූ මුළු විකුණුම් වටිනාකම විකුනුම් සේ සලකා ගිණුම් ගත කර දේශීය ආදායම් දෙපාර්තමේනතුවට ප්‍රේෂණය කල රු.21,584,274 ක් වූ ජාතිය ගොඩනැගීමේ බද්ද වියදමක් ලෙසට ගළපා තිබිණි.

ඇ) 1971 අංක 38 දරණ මුදල් පනතේ වගන්ති අංක 16 අනුව	රාජ්‍ය සංස්ථා විසින් බැංකු අයිරා පහසුකම් උපරිම සීමාවක් සඳහා විෂයභාර අමාත්‍යතුමා හා මුදල් අමාත්‍යතුමාගේ අනුමැතියක් ලබා ගෙන තිබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා රුපියල් මිලියන 99 ක් දක්වා අයිරා පහසුකම් ලබාගෙන ඒ සඳහා රුපියල් මිලියන 10 ක බැංකු අයිරා පොළිය ලෙස වියදම් දරා තිබුණද ඊට අදාළ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.
ඉ) 1983අංක12 දරණ පාරිතෝෂික මුදල් ගෙවීම් පනත	පාරිතෝෂික අරමුදල් සඳහා හිමිකම් ලබන යම් සේවකයකු ඉවත් වීමෙදී දින 30 ක් ඇතුලත එකී හිමිකම් ලබන පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික මුදල් නියමිත කාලය තුල ගෙවීම ප්‍රමාද වීම නිසා සේවකයන්ට රු.3,897,054 ක දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණි.
ඊ) 2002 අංක 14 දරණ එකතු කල අගය මත බදු පනතේ 26 වගන්තිය ප්‍රකාරව	සෑම මසකම එකතු කල අගය මත බදු මුදල් ඊළඟ මාසයේ 20 වන දිනට පෙර ගෙවිය යුතු වුවත් වර්ෂ 2 කට වඩා කාලයක් ගතවී තිබූ රු.15,813,272 ක බදු මුදල් එලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

අ) සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ පර්චස් 117.7 ක් සහ පර්චස් 30 ක භූමි ප්‍රමාණයක් සමාගමකට 2017 මාර්තු 28 දින සිට බදු දී තිබූ අතර උක්ත බදු දුන් පරිශ්‍රයට පරිබාහිරව තවත් පර්චස් 49.7 ක ප්‍රමාණයක් අනවසරයෙන් භුක්ති විඳිමින් තිබුණි. හිඟ බදු කුලී අයකර නොගැනීමත්බදු දුන් භූමි ප්‍රමාණයට පරිබාහිරව භුක්ති විඳිමින් සිටින පර්චස් 49.7 ක ප්‍රමාණය සංස්ථාවේ භුක්තියට පවරා ගැනීමටත් මෙතෙක් කටයුතු කරනොතිබුණි.

ආ) බදු ගැණුම්කාර පාර්ශවය විසින් බදු ගත් පරිශ්‍රයට අමතරව භුක්ති විඳින ඉහත 2016/86 පිඹුරේ Lot –A කොටසේ පර්චස් 29.7 ට අදාළ රජයේ තක්සේරු වාර්තාව අනුව මාසික බදුකුලිය රු.178,333 වන අතර 2017 මාර්තු 28 දින සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.8,024,985 ක බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි.

ඇ) සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක මුදල් ගෙවීමේදී ජීවන වියදම් දීමනාවද ඇතුලත්ව දායක මුදල් ගණනය නොකිරීම නිසා 2006 වර්ෂයේ සිට 2016 මැයි මාසය දක්වා සේවක අර්ථසාධක අරමුදල් සඳහා හිඟ දායක මුදල් හා අධිභාර වශයෙන් රු.170,216,102 ක් ගෙවිය යුතුව තිබුණි.

ඈ) සංස්ථාව විසින් සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමේදී ජීවන වියදම් දීමනාවද ඇතුලත්ව දායක මුදල් ගණනය නොකිරීම නිසා 2006 වර්ෂයේ සිට 2016 මැයි මාසය දක්වා සේවක භාරකාර අරමුදල් සඳහා හිඟ දායක මුදල් රු.15,420,275 ක්ද, අධිභාර වශයෙන් රු.7,710,137 ක් ගෙවිය යුතුව පැවතුණි.

ඉ) කොළඹ කම්කරුවිනිශ්චය සභා නඩු අංක 25302/05/20 අනුව 2016 ජුනි මස සිට 2017 පෙබරවාරි මස දක්වා සේවක අර්ථසාධක අරමුදල් (EPF) සඳහා දායක මුදල් වශයෙන් රු.39,130,742 ක් හා අධිභාර වශයෙන් රු.19,565,370ක් ගෙවිය යුතුව තිබුණි.

ඊ) ස්වේච්ඡා වන්දි සඳහා සංස්ථාව වෙත ලැබී තිබූ භාණ්ඩාගාර අරමුදල් රු.11,511,870 ක් එම අරමුණෙන් පරිබාහිරව හිඟ වැටුප් ගෙවීම සඳහා යොදවා තිබුණි.

උ) රු.5,500,000 කට ප්‍රත්‍යාගණනය කරන ලද අංක KA -7699 දරණ ජීප් රථය ආහාර හා කෘෂිකර්ම සංවිධාන්යට අයත් වන අතර 2014 වර්ෂයේ සිට එම රථය ලංකා ධීවර සංස්ථාව ප්‍රයෝජනයට ගනිමින් තිබුනද එහි අයිතිය සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඌ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ රු.216,854,806 ක් අතරින් වර්ෂ 02 ට වැඩි ණයහිමියන් රු.28,270,680 ක්ද වර්ෂ 01 ට වැඩි ණයහිමියන් රු.2,310,992 ක්ද පැවති අතර රු.39,835,900 ක් අතරින් රු.2,692,486 ක් වර්ෂ 5 ක් ඉක්මවා පැවති අතර රු.17,342,684 ක් වසර 2-5 ත් අතර පැවතියද ඒවා නිරවුල් කර නොතිබුණි.

එ) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට පැවති විවිධ ණයහිමි ශේෂය රු.313,178,701 ක් අතරින් රු.188,300,735 ක් හෙවත් සියයට 60 ක් වර්ෂ 05 කට වඩා වැඩි ණයහිමියන් වූ අතර රු.60,191,966 ක් හෙවත් සියයට 19 ක් වර්ෂ 2 ට වැඩි ණයහිමියන් වූ අතර එම ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

கடற்றொழில், நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு

Ministry of Fisheries & Aquatic Resources Development

දුරකථනය / தொலைபேசி / Telephone: Chairman +94 11 2523689; +94 11 2540455; General +94 11 2523227; +94 11 2523

ලංකා ධීවර සංස්ථාව

இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்

CEYLON FISHERIES CORPORATION

ෆැක්ස් අංකය / தொலை நகல் / Fax No. +94 11 2523385

මගේ අංකය / என் இல. / My No.

ඔබේ අංකය / உங்கள் இல. / Your No.

දිනය / தினம் / Date

CFC/FD/Aud/2017

2023.07.24

විගණකාධිපති,
රජයේ විගණන උප කාර්යාලය,
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය,
නෙ.41/1, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

මහත්මයාණනි / මහත්මියණි,

<u>1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 14(2) සී වගන්තියට අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.</u>

FLS/A/CFC/1/FA/2021/11 සහ 2022.07.20 වන දිනැති ඔබගේ ලිපියට අනුව විගණන වර්තාව පිළිබඳව අපගේ පැහැදිලි කිරීම් සහ නිරීක්ෂන සමඟ පිළිතුරු ඔබ වෙත යොමු කරමි.

මෙයට
විශ්වාසී වූ

සභාපති
ලංකා ධීවර සංස්ථාව

දිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
கடற்றொழில், நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு
Ministry of Fisheries & Aquatic Resources Developemnt

දුරකථනය தொலைபேசி Telephone } Chairman +94 11 2253689 / General +94 11 2540455 / +94 11 2523227 / +94 11 2523228

ලංකා දිවර සංස්ථාව
இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்
CEYLON FISHERIES CORPORATION

ෆැක්ස් අංකය தொலை நகல் Fax No. } +94 11 2523385

මගේ අංකය எனது இல. My No. } CFC/FD/AUD/2022

ඔබේ අංකය உமது இல. Your No. } FLS/A/CFC/2021/AQ/06

දිනය திகதி. Date } 2022.08.10

ඩී.එස්.ගලගම,
විගණන අධිකාරී,
රජයේ විගණන උප කාර්යාලය,
ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය,
නො.41/1, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

ලැබුණා
10 AUG 2022
ජාතික විගණන උප කාර්යාලය

මහත්මයාණනි / මහත්මියණි

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

(අ) 2014 වර්ෂයේදී සංස්ථාව විසින් වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර නිබුණි. එම වර්ෂයේ සිට මේ දක්වා එම සංචිතය සම්බන්ධයෙන් ගිණුම් තබා ඇත්තේ මෙම ක්‍රමවේදයට අනුව වන අතර මේ සඳහාද මීට ඉහතදී විගණන විමසුමක් ඉදිරිපත් නොවුණි.මෙහි අදාල ගැලපුම් 2019 වර්ෂයේ ගිණුම්වලදී සිදු කිරීමට කටයුතු කරමි.

(ආ) හෙලිදරව් කිරීම සිදුකර ඇත. සටහන් අංක 22 (Note) යටතේ හා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලද මේ පිළිබඳව අනාවරණය කර ඇත.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) අදාල ගිණුම්කරණ දෝෂය පිළිබඳ පැහැදිලි කර ගැනීම අපහසු වූ බැවින් ඉදිරි වර්ෂය තුලදී අදාල ගැලපුම් සිදු කිරීමට අවශ්‍ය උපදෙස් වැඩි දුරටත් බලාපොරොත්තු වේ.

(ආ) එකඟ වෙමි. ඉදිරි මූල්‍ය ප්‍රකාශන සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මෙම ගිණුම දිගින් දිගටම පැවතීම නිසා 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 05 තුල කපා හැරීමට තීරණය කෙරුණු අතර මෙහි ගිණුම්කරණ දෝෂ පවතින්නේ නම් අවශ්‍ය උපදෙස් ලබාගෙන 2019 වර්ෂයේ අවශ්‍ය ගැලපීම් ගිණුම්වලට ද ඇතුලත් කිරීමට කටයුතු කරමි.

(ආ) රු.600,000.00 වටිනා 227-6264 දරණ රථයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කළ යුතුව නිබුණු බව පිළිගනිමි. එසේ නොකිරීමෙන් ජංගම නොවන වත්කම් වල ශේෂයෙන් වැඩියෙන් සමුච්චිත ක්ෂය වූ රු.360,000.00ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම පිළිබඳව එකඟ වේ. 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි නිවැරදි කිරීම් සිදු කර ඇත.

(ඇ) අංක KA-7699 දරණ ජීප් රථය ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අයත් වන අතර එය ලංකා දිවර සංස්ථාවට දිවර අමාත්‍යාංශය හරහා ප්‍රයෝජනයට ගැනීමට ලබා දී ඇති අතර එහි අයිතිය දිවර සංස්ථාවට පවරා නොමැති හෙයින් දිවර සංස්ථාවේ ගිණුම් පොත් වලට ඇතුලත්

කර නොමැත. ඒ අනුව මෝටර් රථ ක්ෂය වියදම් වන රු.1,100,000.00ක් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමක් සිදුකළ නොහැක. එබැවින් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා නොමැත.

(ඈ) බොහෝ වෙළඳ කුටි (Stall) බදු / කුලී පදනම මත ලබා ගෙන අලෙවිසැලක් වශයෙන් වැඩි දියුණු කිරීමට සැලකිය යුතු වියදමක් දරනු ලබයි. ඒ අනුව වියදම් කරනු ලබන එම සම්පූර්ණ වියදම් මුදල එම වර්ෂයේම ලාභයට ගැලපීම එම විධායකයේ මෙහෙයුම් කටයුතුවලට බලපෑමක් සිදුවන බැවින් එකී මූලික වියදම වර්ෂ කිහිපයක් තුලදී ලාභයට ගලපා ඇත.

(ඉ) පෙර වර්ෂවලද විගණනයට ඉදිරිපත් කර තිබූ අවසන් ගිණුම් තුලදීද මේ ආකාරයට ගැලපීම් සිදු කර ඇති මුත් මෙතෙක් මේ සඳහා විගණන විමසුමක් ඉදිරිපත් නොවුණි. 2019 වර්ෂයේ ගිණුම් තුලදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරමි.

(ඊ) එකඟ නොවෙමි. 2014 වර්ෂයේදී ප්‍රත්‍යාගනනය සිදු කිරීමේදී රු.3,725,000.00ක වටිනාකමට අගය කරන ලද යන්ත්‍ර (Fork Lift) 04ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ස්ථාවර වත්කම් යටතේ ඇති (Equipment) තුල දක්වා ඇත.

(උ) සමාලෝචිත වර්ෂයේදී විධායකයන් අතර මත්ස්‍යයන් මිලදී ගැනීම් සහ විකිණීම් අතර රු.845,319.00ක වෙනසක් ඇති බවට දක්වා ඇති මුත් අපගේ මූල්‍ය ප්‍රකාශනය තුල එවැනි වෙනසක් නොපෙන්වයි. මූල්‍ය ප්‍රකාශයට අනුව විධායකයන් අතර මත්ස්‍ය විකුණුම් වටිනාකම රු.703,596,342.00කි (මසුන් සහ කරවල). මත්ස්‍ය මිලදී ගැනීම් වටිනාකම වනුයේ රු.703,264,027.00කි. මෙම මත්ස්‍ය විලදීගැනීම් සහ විකිණුම් අතර පවතින රු.332,315.00ක ශේෂය විධායකයන් අතර කරවල මිලදී ගැනීම් වටිනාකම වේ.

ඒ අනුව විධායක විකිණීම් සහ මිලදී ගැනීම් අතර වෙනසක් නොපෙන්වයි.

(ඌ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය) ගණනය කිරීමේදී අදාල වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයයෙන් ජනිත වන මුදල් ප්‍රමාණය ගණනය කිරීමේදී අදාල වර්ෂයට අදාල නොවන මූල්‍ය නොවන ගෙවීම් එම වර්ෂයේ මූල්‍ය ලාභයට ගැලපිය යුතුවේ. ඒ අනුව රු.175,550,923.00 යනු පසුගිය වර්ෂයන්ට අදාල වන්නා වූ ගැලපීමකි. (Prior year adjustment) මේ තුලින් මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ජනිත වූ ප්‍රමාණය රු.351,101,846.00න් අඩුවෙන් දැක්වීමක් සිදුවී නොමැත.

(එ) මේ සම්බන්ධයෙන් අදාල ගැලපීම් නිවැරදි ලෙස ඉදිරි මූල්‍ය ප්‍රකාශනයන්හි සිදු කිරීමට කටයුතු කරමි.

(ඒ) 2017 වර්ෂයේ දේපල පිරියත උපකරණ මිලදී ගැනීම් රු.18,226,001.00ක් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපල පිරියත උපකරණ ලෙස පෙන්වා ඇති රු.16,483,851.00ක වටිනාකම ගණනය වී ඇත්තේ වර්ෂයේ මිලදී ගැනීම් වටිනාකමට, එම වර්ෂයේ වත්කම් ඉවත් කිරීම් වටිනාකම වන රු.4,800,000.00 හා වත්කම් ඉවත් කිරීමෙන් ලද ලාභය වූ රු.3,057,850.00 ගැලපීමෙන් වන අතර, ආයෝජන ක්‍රියාකාරකම් යටතේම නැවතත් වත්කම් විකිණීමෙන් ලද ලාභයට ගලපා ඇත.

(ඔ) 2017 වර්ෂයේ ලීසිං වාරික ගෙවීමේ උප ලේඛණයේ රු.2,998,008.00ක් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් ලෙස දක්වා ඇත. මෙහි තුල වර්ෂයට අදාල කල් බදු ලීසිං ණය පොළී ප්‍රමාණයද ඇතුලත්ව ඇත. විගණන විමසුමේ දක්වා ඇති 285,099.00 යනු එම පොළී ප්‍රමාණයයි. එම පොළී ප්‍රමාණය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී ගැලපීමක් ලෙස ලාභයට ගලපා ඇත.

(ඕ) සමාලෝචිත වර්සයේ වාහන හා අබලි වාහන විකුණුම් ආදායම රු.5,930,777.00කි මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති රු.3,057,850.00 වටිනාකම් ලෙස පෙන්වා ඇත්තේ වාහන හා අබලි විකිණීමෙන් ලද ශුද්ධ ලාභයයි.

(ක) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන ප්‍රදාන වලට අදාලව එම ප්‍රදාන වලට අදාල බොහෝ හඳුනාගත හැකි වත්කම්වල ජීවකාලය මත පදනම්ව ක්‍රමක්ෂය ගණනය කිරීම සිදුකර ඇත. පෙර වර්ෂවලදී ආයතනය වෙත ලැබී තිබූ ප්‍රාග්ධන ප්‍රදාන වලට අදාල වත්කම් සඳහා ක්‍රමක්ෂය ගණනය කිරීම් කර ගිනුම් සටහන් ගැලපුම් සිදුකොට ඇති ලෙජර ශේෂ හා ඒ වෙනුවෙන් ඇති උපලේඛණ ශේෂ පරීක්ෂා කර ගෙන යාමේදී වෙනස් කරම් ඇති බවට නිරීක්ෂනය වූ හෙයින් 2017 වසරේදී එම වෙනස් කම් ඇති ඇති ආකාරය පිළිබඳ ලේඛණයක් පිළියෙල කොට එසේ ඇති වූ වෙනස් කම් ශේෂය 2017 වසරේ සිට වසර 05ක් තුල බෙදා වෙන්කොට ගිණුම සඳහා ගැලපීම් සිදු කොට ඇත. විගණන විමසුමේ සඳහන් කර ඇති රු.28,553,054.00න් ක්‍රමක්ෂය ආදායම අඩුවෙන් ගිනුම්ගත කර ඇති බව දන්වා ඇති අතර එම ශේෂය සකස් වී ඇති ආකාරය පිළිබඳ තොරතුරක් ලබා දුනහොත් ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම සිදුකල හැක..

(ග) එකඟ වෙමි. අවශ්‍ය උපදෙස් ලබා 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල නිවැරදි ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි.

(ච) 2016 වර්ෂයේ ලද ස්වේච්ඡා වන්දි සඳහා වූ භාණ්ඩාගාර අරමුදලින් සමාලෝචිත වර්ෂයේ ස්වේච්ඡා වන්දි ක්‍රමය යටතේ විශ්‍රාම ගන්වන නිලධාරීන් හට ගෙවීම් කිරීමෙන් පසු ඉතිරිව ඇති මුදල් ස්වේච්ඡා වන්දි පදනම මත විශ්‍රාම ගිය සේවකයිනගේ සියළු හිඟ වැටුප් ගෙවීමට හා වැටුප් නොගෙවා ඇති විධායකයන් සඳහා වැටුප් ගෙවීමට අංක 1020 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව 2017 වර්ෂයේදී රාජ්‍ය ප්‍රදාන ආදායම ලෙස රු.20,582,127.00ක් දක්වා ඇත. රු.11,511,870.00න් රාජ්‍ය ප්‍රදාන ආදායම අධිතක්සේරුවක් වී නොමැති බවද දන්වමි.

(ට) විධායක අතර ජංගම ගිණුම් සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017.12.31 දිනට රු.21,557,771.00ක වෙනසක් නිරීක්ෂනය වූ බව දක්වා ඇති මුත් මූල්‍ය ප්‍රකාශයට අනුව එය සටහන් වී ඇත්තේ රු.21,547,777.00ක් ලෙසිනි. මෙම විධායක ජංගම ගිණුම් අතර ඇති වෙනස්වීම, 2018 වර්ෂයේ අවසන් ගිණුම්වලදී බොහෝ දුරට නිවැරදි කිරීම් සිදු කර ඇත. තවද ඔබ විසින් මෙම ජංගම ගිණුම් අතර ඇති වෙනස් වීම් 2017 වසරේ මූල්‍ය ප්‍රකාශන වල අවිනිශ්චිත ගිණුමේ ශේෂය වූ. රු.34,886,249.00ක් තුල අන්තර්ගතවී ඇති බවට දක්වා ඇතත් ගිනුම්වල එසේ සඳහන් වී නොමැති බව දන්වමි. තවද මෙම ජංගම ගිණුම් ශේෂය හා අවිනිශ්චිත ගිනුම් ශේෂ මූල්‍ය ප්‍රකාශන තුල වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

(ඩ) (ණ) ආයතනයේ මූල්‍ය තත්වය යහපත් තත්වයක නොතිබීම හේතුකොටගෙන මෙම ගෙවීම් සිදු කිරීමට නොහැකි වී ඇති අතර මූල්‍ය තත්වය යහපත් තත්වයට පත්වූ වහාම මෙම ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) විගණන විමසුමේ දක්වා ඇති පැරණි ණය ගැනි ශේෂයන්හි අවු.10ට, 05ට හා 03ට වැඩි ණය ගැනියෝ අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු සඳහා යොමුකරමින් පවතී. තවද රාජ්‍ය සැපයුම් අංශය යටතේ වෙනත් ණය ලෙස දක්වා තිබූ ශේෂය වන රු.939,938.00ක මුදල හඳුනාගෙන ඇති අතර එය රෝහල් සඳහා ආදේශක සැපයීම වෙනුවෙන් ලැබී නොමැති මුදල වේ.

(ආ) 2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව පැවති වෙනත් ලැබිය යුතු රු.63,382,714.00ක ණය ශේෂය තුල ඇති වර්ෂ 05ක් ඉක්මවා ඇති ණයශේෂ ලෙස දක්වා ඇති වටිනාකමින් වැඩි ප්‍රමාණය වෙනුවෙන් නීතිමය පියවර ගැනීමට කළමනාකාරිත්ව විසින් පියවර ගෙන ඇත. එසේ නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබූ ආයතන කිහිපයක් පහතින් දක්වා ඇත.

Colombo Marine Debtors	–	Rs.3,800,000.00
R&R Export	-	Rs. 2,125,000.00
Batticaloa Ice Plant Debtor	–	Rs.5,958,840.00

(ඇ) විගණන විමසුම සඳහා එකඟ නොවන අතර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල පෙර කල ගෙවීම් ලේඛනයේ (Deposit & Pre payment) වර්ෂ 05ට වඩා වැඩි ලෙස දැක්වූ අගය තුල ඇති සේවක ඇප තැන්පතු (NSB) ලෙස දක්වා ඇති රු.12,338,059.00ක වටිනාකම සක්ස වී ඇත්තේ සංස්ථාවේ මුදල් හා බැංකු කටයුතු සම්බන්ධයෙන් රාජකාරී කටයුතු වල නිරත වන සේවකයින්ගෙන් මාසිකව මූල්‍ය වටිනාකමක් වැටුපෙන් අඩුකර එය ඔවුන් නමින් ඉතිරි කිරීමේ ගිනුමක තැන්පත් කරනු ලබන වටිනාකම්වල එකතුවයි. එමෙන්ම එහි Stall deposit ලෙස දක්වා ඇත්තේ සංස්ථාව විසින් කුලී පදනම මත ලබාගත් අලෙවිසැල් වෙනුවෙන් භාහිර පාර්ශවයන් වෙත තැන්පත් කර ඇති වටිනාකම් වන අතර මෙම වෙළඳසැල් වසා අවසන් කරන තෙක් මෙම මුදල් නැවත අයකර ගැනීමක් සිදු නොවන හේතුවෙන් මෙම ශේෂ අඛණ්ඩව ඉදිරියට ගෙන යාමක් සිදුවන හෙයින් එම ශේෂයන් තෙවන පාර්ශවයන් වෙතින් කඩිනමින් අයකර ගැනීම අපහසු කරුණකි.

(ඈ) එකඟ වෙමි. අවශ්‍ය ගැලපීම් ඉදිරි වර්ෂයන්හි සිදුකිරීමට කටයුතු කරමි.

(ඉ) ආයතනය තුල පවතින මූල්‍ය අර්බුදය හේතුවෙන් ණයහිමියන්ට ගෙවීම් කිරීම ප්‍රමාද වීම් මත මෙසේ දීර්ඝ කාලීන ණයහිමි ශේෂයක් පෙන්නුම් වේ. ඉදිරියේදී මූල්‍ය තත්වය යහපත් වූ විට අවශ්‍ය ගෙවීම් සිදු කිරීමට බලාපෙරොත්තු වේ.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුල විවිධ ණයහිමි ශේෂ ලෙස වැඩි වටිනාකමක් පිළිඹිඹු වීමට මූලික හේතුවක් වී ඇත්තේ ආයතනයේ ඇති දැඩි මූල්‍ය අර්බුදයයි.මේ හේතුවෙන් අදාල ගෙවීම් නියමිත දිනට භාහිර පාර්ශවයන් වෙත ගෙවා ගත නොහැකි වූ තත්වයක් මත ගිණුම්වල මෙම ශේෂය පෙන්නුම් වේ. මේ වනවිට ඇතැම් ගෙවීම් කොටස් වශයෙන් ගෙවීමට කටයුතු කරමින් සිටින අතර ආයතනයේ මූල්‍ය තත්වය යහපත් වූ විට ඉතිරි ණයහිමි ශේෂයන්ද හැකි ඉක්මනින් නිරවුල් කිරීමට අපේක්ෂා කරමි.

(උ ඌ) එකඟ වෙමි. මූල්‍ය තත්වය යහපත් වූ විට මෙම ගෙවීම්ද ඉතා ඉක්මනින් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

2.2.5 විගණනයට ලිඛිත සාක්ෂි නොවීම

ලංකා ධීවර සංස්ථාවේ වර්ෂ ගණනාවක සිට ලෙජරය යාවත්කාලීන කිරීම ප්‍රධාන ජර්නලයක් මඟින් සිදුකර ඇත. ලෙජරයේ සටහන් කර ඇති සියළුම අයිතමයන් සඳහා ජර්නල් සටහන් එම ප්‍රධාන ජර්නලයේ දක්වා ඇත. එය විගණනයට අවශ්‍ය ඕනෑම අවස්ථාවක එහි නිවැරදි භාවය පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛණ ඉදිරිපත් කළ හැකි බව සඳහන් කරමි. 2020 වර්ෂයේ සිට ඔබ විසින් දක්වා ඇති පරිදි ජර්නල් වවුචර්පත් යොදා ගැනීම සිදුකරනු ලබන බව සඳහන් කරමි. එමෙන්ම විගණන විමසුමේ තවදුරටත් දක්වා ඇති පරිදි හානි ප්‍රතිපූර්ණය කිරීම ලෙස මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති රු.143,403,352.00 හානි ප්‍රතිපූර්ණ ගිණුම වෙනුවෙන් ජර්නල් සටහන් හා මූලාශ්‍ර ලිසිවිලි ඉදිරිපත් නොවූ බවට සඳහන් වී ඇති නමුත් මෙම ගිණුම 1995 වර්ෂයට පෙර සිටම සංස්ථාව විසින් සකස් කර ඇති අවසන් ගිණුම් වාර්තාවලද පෙන්වා ඇති බැවින් මේ සම්බන්ධයෙන් ඔබ විසින් ඉල්ලා ඇති ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන බවයි.

(ඇ) දීර්ඝකාලීන පවතින පැරණි ශේෂයන් බැවින් අදාල විස්තර ලබා ගැනීමේ අපහසුතාවයක් පවතී. එසේ හෙයින් මේ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමේ අපහසුතාවයක් පවතී.

2.2.6 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

(අ) 2017.12.31 දින බැංකු සැසඳුම් විස්තරයේ මෙම චෙක්පත් අනපසු වීමක් මත සිදු වී ඇති බව පිළිගන්නා අතර එය 2018 අප්‍රේල් මස මුදල් පොත මඟින් නිවැරදි කිරීම සිදුකර ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි.

(ආ) මේ සම්බන්ධයෙන් අදාල පිළිතුරු මෙම විගණන විමසුමේම අංක 3 කළමනාකරණ අකාර්යක්ෂමතා (ඇ) තුල දක්වා ඇත.

(ඇ) 2017 වර්ෂයද ඇතුළුව පෙර වර්ෂවලදී ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්හි මේ ආකාරයට විකුණුම් මත ගණනය කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) වියදමක් ලෙස ගලපා විගණනයට ඉදිරිපත් කර ඇත. මේ දක්වා ඒ සඳහා විගණන විමසුම් ඉදිරිපත් නොවුණි. (2009 අංක 09 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව මෙම ජාතිය ගොඩනැගීමේ බද්ද පාරිභෝගිකයන්ගෙන් අයකළ යුතු බවට නිශ්චිතවම දක්වා නොමැත.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාගෙන ඇති රුමිලියන 99 දක්වා අයිරා පහසුකමින් ප්‍රධාන අයිරා පහසුකම් 02ක් වන ගිණුම් අංක 1846 හා 1257 වෙත ලබා දී ඇති අයිරා පහසුකම වර්ෂ කිහිපයක සිට අවශ්‍ය මූල්‍ය කටයුතු වෙනුවෙන් යොදා ගැනීමට අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇති අතර අනිකුත් අයිරාවන් ගනුදෙනු කිරීමේදී ගොඩනැගුණු විශ්වාසය මත තාවකාලිකව ලබා ගත් අයිරා පහසුකම් බව සඳහන් කරමි.

(ඉ) ලංකා ධීවර සංස්ථාව තුල පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් සේවා පාරිතෝෂික ගෙවීම් කිරීමේදී විශ්‍රාම යාමෙන් දින 30ක් ඇතුලත ගෙවීම් කිරීමට නොහැකි වූ අතර කම්කරු පනතට අනුව අදාල කාලසීමාව තුල ගෙවීම් සිදු නොකළහොත් අධිභාර මුදලක් අදාල සේවකයා වෙත ගෙවිය යුතු වේ. පැවති මූල්‍ය අර්බුදය විසඳා ගැනීමට අදාල කාලය තුල නොහැකි වූ අතර 2018 වර්ෂයේදී මහා භාණ්ඩාගරය මඟින් ලද මූල්‍ය ප්‍රතිපාදන මඟින් මුදල් ගෙවීම් සිදුකර ඇත.

(ඊ) ආයතනයේ පැවති මූල්‍ය දුෂ්කරතා මත නියමිත දිනට එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට නොහැකි වූ අතර මූල්‍ය තත්වය යහපත් වූ වහාම මෙම ගෙවීම් සිදු කිරීමට කටයුතු කරමි.

3. කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ, ආ) මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) 2006 වර්ෂයේ සිට 2016 මැයි දක්වා වූ කාලය සඳහා ගෙවිය යුතු හිඟ ජීවන වියදම් දීමනාව වන රු.178,216,101.66 මුදල (අධිභාරය ඇතුලත්ව ගෙවිය යුතුව ඇති අතර කම්කරු විනිශ්චය සභාව මඟින් පනවන ලද නඩුවේ තීන්දුවකට අනුව මාසිකව රු.500,000.00 බැගින් වාරික ගෙවීම් සිදු කරනු ලබයි. 2022.04.25 විගණන දිනය වන විට ඉහත මුදලින් රු.8,000,000.00ක මුදලක් ගෙවීම් සිදුකර ඇත. දැනටමත් මෙම වාරික මුදල අදාල නඩු දිනයන්හිදී ගෙවීම් කරගෙන යනු ලබයි.

(ඈ) සේවක භාරකාර අරමුදලට ජීවන වියදම් දීමනාවේ හිඟ දායක මුදල ලෙස 2006 වර්ෂයේ සිට 2016 මැයි මස දක්වා හිඟ දායක මුදල ලෙස රු.15,420,275.00ද අධිභාරය වශයෙන් රු.7,710,137.00ද ගෙවීමට පවතින අතර මූල්‍ය ප්‍රතිපාදන ලද විගස ගෙවීම් සිදු කිරීමට තීරණය කර ඇත.

(ඉ) 2017 වර්ෂයේ ජුනි මස සිට 2017 පෙබරවාරි මස දක්වා සේවක අර්ථසාධක අරමුදල් වශයෙන් රු.58696113.18ක මුදලක් අධිභාරයද ඇතුලත්ව පවතින අතර කම්කරු විනිශ්චය සභා නඩු අංක 25302/05/20 මඟින් නියෝග කර ඇති පරිදි මාසිකව රු.200,000.00 බැගින් වාරික මුදලක් ගෙවිය යුතවේ. ඒ අනුව විගණන දිනය වන 2022.04.25 වනවිට රු.3,000,000.00ක මුදලක් කම්කරු විනිශ්චය සභාව වෙත ගෙවා ඇත. අදාල නඩු දිනයන්හිදී මාසිකව පනවා ඇති වාරික මුදල් ගෙවීම මේ වනවිට සිදු කරමින් පවතී.00

සභාපති
ලංකා ධීවර සංස්ථාව

සභාපති
ලංකා ධීවර සංස්ථාව
රොක්හවුස් පවුම්ග, ඕදර, කොළඹ 15

ලංකා ධීවර සංස්ථාව
(රාජ්‍ය කාර්මික සංස්ථා පනත 49 යටතේ 1957 ස්ථාපනය කර ඇත.)
මූල්‍ය තත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	**31/12/2017** **රු.ශත**	**31/12/2016** **රු.ශත**
වත්කම්		
ජංගම නොවන වත්කම්		
දේපල පිරියත හා උපකරණ	1,425,393,530	1,466,362,217
ආයෝජන දේපල	72,129,800	73,048,350
බද්ද ව්‍යාපාර ආයෝජන	110,000,000	110,000,000
ස්ථාවර තැන්පතු	200,000	6,200,000
ආපදා ණය	2,807,293	1,137,668
ජංගම නොවන වත්කම්වල එකතුව	1,610,530,623	1,656,748,235
ජංගම වත්කම්		
තොගය	57,314,772	32,382,454
වෙළඳ සහ අනිකුත් ලැබිය යුතු	358,447,283	345,522,973
ආපදා ණය	1,855,555	-
මුදල් සහ ආසන්න මුදල්	25,024,012	49,372,175
ජංගම වත්කම්වල එකතුව	442,641,622	427,277,602
මුළු වත්කම්	2,053,172,245	2,084,025,837
ස්කන්ධ ප්‍රාග්ධනය සහ වගකීම්		
ස්කන්ධය		
ශ්‍රී ලංකා රජයේ ප්‍රාග්ධන දායකත්වය	326,609,805	326,609,805
ප්‍රාග්ධන සංචිතය	24,258,241	24,258,241
ප්‍රත්‍යාගණන සංචිතය	1,216,341,016	1,261,669,644
රඳවාගත් අලාභ	(1,041,875,104)	(868,531,659)
ස්කන්ධ ප්‍රාග්ධනය	525,333,957	744,006,032
ජංගම නොවන වගකීම්		
දිගුකාලීන ණය	142,922,000	142,922,000
වෙනත් ආදායම - මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන	489,389,173	551,166,949
පාරිතෝෂික වෙන්කිරීම්	36,884,879	78,633,291
කල්බදු ණයහිමි	1,518,803	2,839,343
මුළු ජංගම නොවන වගකීම්	670,714,855	775,561,583
ජංගම වගකීම්		
ණය හිමියෝ (බදු)	1,320,540	2,712,909
වෙළඳ හා අනිකුත් ගෙවිය යුතු	741,814,493	469,810,861
වෙනත් පාර්ශවයන් වෙත ගෙවිය යුතු මුදල්	14,800,509	17,804,078
බැංකු අයිරාව	99,187,891	74,130,373
මුළු ජංගම වගකීම්	857,123,433	564,458,221
මුළු වගකීම්	1,527,838,288	1,340,019,805
ස්කන්ධ ප්‍රාග්ධනය සහ වගකීම්වල එකතුව	2,053,172,245	2,084,025,837

ලංකා ධීවර සංස්ථාව
(රාජ්‍ය කාර්මික සංස්ථා පනත 49 යටතේ 1957 ස්ථාපනය කර ඇත.)
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		**2017**	**2016**
		රු.	**රු.**
	සටහන්		
මුළු පිරිවැටුම	**15**	2,127,438,604	2,735,721,733
විකුණුම් පිරිවැය		(1,624,276,384)	(2,290,586,164)
දළ ලාභය		503,162,220	445,135,569
වෙනත් ආදායම්	**16**	268,306,623	934,064,735
පරිපාලන වියදම්		(648,911,436)	(1,033,348,547)
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්		(108,411,691)	(85,413,253)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල		14,145,716	260,438,505
මූල්‍ය පිරිවැය	**17**	(11,938,239)	(12,609,568)
බදුවලට පෙර ලාභය /අලාභය		2,207,477	247,828,937
බදු වියදම්		-	-
වර්ෂයේ ශුද්ධ ලාභය /අලාභය		2,207,477	247,828,937
වෙනත් විස්තීර්ණ ආදායම්		-	
විශ්‍රාම සැලසුම් සත්‍ය ලාභ /අලාභ		38,750,253	55,121,381
සමස්ත විස්තීර්ණ ආදායම		40,957,730	302,950,318

ලංකා ධීවර සංස්ථාව
(රාජ්‍ය කාර්මික සංස්ථා පනත 49 යටතේ 1957 ස්ථාපනය කර ඇත.)
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	31/12/2017 රු.ශත	31/12/2016 රු.ශත
	සටහන්	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		
වර්ෂයට අදාල ශුද්ධ ලාභය / (අලාභය)	**2,207,477**	**247,828,937**
ගැලපුම්		
පොළී වියදම් හා මූල්‍ය පිරිවැය	11,938,239	12,609,568
ක්ෂය කිරීම්	77,238,935	77,930,509
ක්‍රමක්ෂය	(159,277,776)	(24,644,759)
ප්‍රත්‍යාගණන අතිරික්තය	(45,328,629)	(45,328,629)
පාරිතෝෂික වෙන්කිරීම්	12,424,758	55,121,381
වෙනත් මූල්‍ය නොවන වියදම්	(175,550,923)	3,965,865
කාරක ප්‍රාග්ධන ගැලපුම් කිරීමට පෙර මෙහෙයුම් අලාභ	**(276,347,919)**	**327,482,872**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම		
තොග වෙනස්වීම්	(24,932,318)	25,768,571
වෙළඳ සහ අනිකුත් ලැබීම්වල වෙනස්වීම්	(16,449,490)	27,124,345
වෙළඳ සහ වෙනත් ගෙවීම්වල වෙනස්වීම්	272,003,632	(143,691,006)
භාණ්ඩාගාර පාර්ශවයන් වෙත ගෙවිය යුතු වටිනාකමේ වෙනස්වීම්	(3,003,570)	13,570,592
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය	(48,729,664)	250,255,375
පාරිතෝෂික ගෙවීම්	(54,173,170)	(56,762,445)
පොළී ගෙවීම්	(11,938,239)	(12,609,568)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙනුවෙන් උපයෝගී කොටගත් ශුද්ධ මුදල් ප්‍ර	**(114,841,073)**	**180,883,362**
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(16,483,851)	(32,137,188)
අලෙවිසැල් ඉදිකිරීමේ පිරිවැය හා නොනිමි වැඩ වැඩිවීම	(21,925,697)	10,670,403
ප්‍රදාන - පිරිසැකසුම් ඒකකය	97,500,000	-
අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද ආදායම	3,057,850	6,132,232
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම්	6,000,000	-
ආයෝජන ක්‍රියාකාරකම් වෙනුවෙන් උපයෝගී කොටගත් ශුද්ධ මුදල් ප්‍රමාණය	**68,148,301**	**(15,334,553)**
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහය		
ආපසු ගෙවූ ණය	-	(113,582,457)
ආපසු ගෙවූ ලීසිං වාරික	(2,712,909)	(2,757,424)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රමාණය	**(2,712,909)**	**(116,339,881)**
මුදල් සහ ආන්න මුදල් වල ශුද්ධ වැඩිවීම / අඩුවීම්	(49,405,681)	49,208,927
වර්ෂය ආරම්භයේ මුදල් හා ආසන්න මුදල් ශේෂය	(24,758,199)	(73,967,126)
වර්ෂය අවසානයේ මුදල් හා ආසන්න මුදල් ශේෂය	**(74,163,880)**	**(24,758,199)**

ලංකා ධීවර සංස්ථාව
(රාජ්‍ය කාර්මික සංස්ථා පනත 49 යටතේ 1957 ස්ථාපනය කර ඇත.)
ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීමේ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	ශ්‍රී ලංකා රජයේ ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්ඡිත අලාභ	එකතුව
		රු.	රු.	රු.	රු.
2016 ජනවාරි 01 දිනට ශේෂය	326,609,805	24,258,241	1,306,998,274	(1,113,014,605)	544,851,715
ගැලපීම්			(45,328,629)	(3,345,991)	(48,674,620)
වර්ෂය තුල ශුද්ධ ලාභය (අලාභය)				247,828,937	247,828,937
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	326,609,805	24,258,241	1,261,669,645	(868,531,659)	744,006,032
2017 ජනවාරි 01 දිනට ශේෂය	326,609,805	24,258,241	1,261,669,645	(868,531,659)	744,006,032
ගැලපීම්		-	(45,328,629)	(175,550,923)	(220,879,552)
වර්ෂය තුල ශුද්ධ ලාභය / අලාභය		-	-	2,207,477	2,207,477
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය	326,609,805	24,258,241	1,216,341,016	(1,041,875,104)	525,333,957

ලංකා ධීවර සංස්ථාව
(රාජ්‍ය කාර්මික සංස්ථා පනත 49 යටතේ 1957 ස්ථාපනය කර ඇත.)
මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ සටහන්

2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2 ස්ථාවර වත්කම් උප ලේඛණය - දේපල පිරියත හා උපකරණ

	ඉඩම්	රථ වාහන	ගොඩනැගිලි	උපකරණ	අයිස් යන්ත්‍රාගාර හා ශීතාගාර	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	පරිඝණක දෘඩාංග	පරිඝනක මෘදුකාංග	එකතුව 2017	එකතුව 2016
	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත
වත්කම් පිරිවැය										
ආරම්භක දිනට ශේෂය	822,700,950	159,300,000	373,497,980	52,913,632	333,656,848	10,572,654	3,617,501	100,000	1,756,359,566	1,795,153,895
වර්ෂය තුල එකතු කිරීම්				16,388,853		1,605,949	231,200		18,226,002	32,137,188
වර්ෂය තුල බැහැර කිරීම්		(4,800,000)							(4,800,000)	(70,931,516)
වර්ෂය අවසාන දිනට ශේෂය	822,700,950	154,500,000	373,497,980	69,302,485	333,656,848	12,178,603	3,848,701	100,000	1,769,785,568	1,756,359,567
සමුච්ඡිත ක්ෂය වීම්										
ජනවාරි 01 දිනට ශේෂය		91,583,333	22,384,063	12,394,842	96,795,352	3,035,137	2,337,395	100,000	228,630,122	219,111,110
වසර තුල අයකිරීම්		30,760,000	7,469,960	6,284,792	33,365,685	1,116,148	942,350		79,938,935	77,930,509
බැහැර කිරීමට අදාල ක්ෂය	වෙන් කිරීම	(2,700,000)							(2,700,000)	(68,411,497)
වර්ෂය අවසාන දිනට ශේෂය	-	119,643,333	29,854,022	18,679,634	130,161,037	4,151,285	3,279,746	100,000	305,869,057	228,630,122
ශුද්ධ වටිනාකම										
2017 සෙප්තැම්බර් 31 දිනට	822,700,950	34,856,667	343,643,958	50,622,851	203,495,811	8,027,318	568,956	-	1,463,916,510	
2016 දෙසැම්බර් 31 දිනට	822,700,950	67,716,667	351,113,918	40,518,790	236,861,496	7,537,517	1,280,106	-		1,527,729,444
අලෙවිසැල් ඉදිකිරීමේ පිරිවැය									8,309,094	9,726,470
නොනිමි වැඩ									23,343,073	-
යාපනය අලෙවිසැල									1,954,653	1,954,653
									1,497,523,330	1,539,410,567
2 ආයෝජන දේපල									(72,129,800)	(73,048,350)
									1,425,393,530	1,466,362,217

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

01. ආයතනික තොරතුරු

වාර්තාකරන ආයතනය

ලංකා ධීවර සංස්ථාව ශ්‍රී ලංකාවේ ස්ථාපනය වූ සංස්ථාවකි. 1957 අංක 49 දරණ කාර්මික පනත යටතේ සංස්ථාගත කරන ලද අතර 1964 වර්ෂයේ සිට මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 15, රොක් හවුස් පටුමග , කොළඹ 15 වේ.

ඉහත මූල්‍ය වර්ෂය තුලදී සංස්ථාවේ ප්‍රධාන කාර්යය වනුයේ මත්ස්‍ය අස්වැන්න රටපුරා විකිණීම හා අයිස් නිෂ්පාදනය ධීවරයින්ට විකිණිමයි.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

සකස් කිරීමේ පදනම

අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් සම්මත කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ පොදු ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂකවරුන් විසින් 2019 ඔක්තෝබර් 22 දින අනුමැතිය සහිතව ඉදිරිපත් කරන ලදී.

මිනුම් කිරීමේ පදනම

විශේෂයෙන් සඳහන් කළ අවස්ථාවල හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන සකස් කර ඇත.

ක්‍රියාකාරී මුදල්

සංස්ථාවේ ක්‍රියාකාරී මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් (“LKR”) මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව යොදවා ඇති අතර වත්මන් වර්ෂය ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය සෑම තැනකම පෙර වසරේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

වාර්තාකරණ කාලයෙන් පසු සිදුවීම්

වාර්තාකරණ කාලයෙන් පසුව ඇති සියළුම හිතකර හා අවාසිදායක ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා මූල්‍ය ප්‍රකාශනයේ සුදුසු ගැලපීම් හෝ හෙලිදරව් කිරීම් සිදුකර ඇත.

ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතය

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ වාර්තාකළ වත්කම් , වගකීම් ආදායම් සහ වියදම් ප්‍රමාණය අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස්විය හැක.
ඇස්තමේන්තු සහ පහතින් පවතින උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ.
ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන ඇස්තමේන්තුව සංශෝධනය කරන කාල සීමාව තුළ සහ බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයකදී හඳුනා ගැනේ.
විශේෂයෙන්ම, මල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදල් ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇතිකරන සැලකිය යුතු ක්ෂේත්‍ර ඇස්තමේන්තු අවිනිශ්චිතභාවය සහ තීරණාත්මක විනිශ්චයන් අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු පහත සටහන්වල විස්තර කෙරේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන් අංක 02 - පිරියත යන්ත්‍ර සහ උපකරණ

සටහන් අංක 05 - වෙළඳ ලැබීම්

සටහන් අංක 04 - තොගය

පහත දක්වා ඇති සැලකිය යුතු අන්තර්ගත ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල සෑම කාලපරිච්ඡේදයකටම අනුකූලව ඉදිරිපත් කර ඇත.

මූල්‍ය උපකරණ

<u>මූල්‍ය වත්කම්</u>

වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

මූල්‍යකරණ ගනුදෙනුවක් සම්බන්ධ කටයුත්තක් වන විට හැර වෙළඳ ලැබිය යුතු දෑ බලාපොරොත්තු විය හැකි වට්ටම් නොකල අගයෙන් හඳුනාගනී.(ශුද්ධ අගය අඩුවීම) විකුණුම් සාමාන්‍ය ණය කොන්දේසි මත සිදුවන අතර වෙළඳ ලැබිය යුතු දෑ වලට පොළියක් උපචිත නොවේ. වෙළඳ ලැබිය යුතු දෑ වලට ගෙන යන අගය අයකරගත නොහැකි බවට සාධාරණ සාක්ෂි ඇති විට එම අගය අඩුවීම ලාභාලාභ ගිණුමට ලියා හරී.

මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන එකඟ වූ අගයකට පරිවර්තනය කළ හැකි ඉහළ ද්‍රවශීල ආයෝජන වටිනාකම් ප්‍රමාණාත්මක වෙනස්වීම් වල අවදානමට යටත්ව මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස හඳුනාගනී.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පරමාර්ථයන් සඳහා මුදල් සහ මුදල් වලට සමාන දෑ ලෙස අතැති මුදල් ස්ථාවර වත්කම්වල ආයෝජන සහ බැංකු තැන්පතු, ඉල්ලූ විට ගෙවිය යුතු ශුද්ධ බැංකු අයිරා සංස්ථාවේ මුදල් කළමනාකරණයේ වැදගත් උපාංග වේ.

හඳුනා ගැනීම් - ඉවත් කිරීම්

මූල්‍ය වත්කම් පහත සඳහන් අවස්ථා වලදී පමණක් හඳුනා නොගනී.(ඉවත් කරයි)

(අ) මූල්‍ය වත්කම්වල එකඟ වූ මුදල් ප්‍රමාණයන් සඳහා වූ අයිතිය කල් ඉකුත් වූ විට හෝ එකඟ වූ විට හෝ

(ආ) සියළුම අවදානම් හා ප්‍රතිලාභ වල හිමිකාරිත්වය ප්‍රමාණාත්මක කොටසක් වෙනත් පාර්ශවයකට හුවමාරු කර ඇති විට.

මූල්‍ය වත්කම්වල අගය අඩුවීම.

වත්කම්වල අගය අඩුවීම සම්බන්ධව සාක්ෂි තිබේද යන්න පරීක්ෂා කිරීමට සියළුම මූල්‍ය වත්කම් වාර්තා කරන වර්ෂ අවසානයේදී අගය කරනු ලැබේ. අගය අඩුවී ඇති බවට සාක්ෂි ඇත්නම් අලාභය විස්තීර්ණ ආදායම් ගිණුමට වහාම ගලපනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය වගකීම්

ගිවිසුම්ගත විධිවිධානවල සාරය අනුව මූල්‍ය වගකීම් වර්ගීකරණය කර ඇත. සමාගමේ මූල්‍ය වගකීම්වලට වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු සහ ණය ගැනීම් ඇතුළත් වේ. ව්‍යුත්පන්නයන් හැර අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් මුලින් හඳුනාගනු ලබන්නේ ඒවායේ සාධාරණ වටිනාකම සහ මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මත වන අතර පසුව වට්ටම් කිරීමේ බලපෑමෙන් මිස ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ කළ පිරිවැයකින් මනිනු ලැබේ. මෙම අවස්ථාවෙහිදී ඒවා පිරිවැය ලෙස දක්වා ඇත.

ප්‍රතිපාදන

අතීත සිදුවීම් මත පූර්ව වගකීමක් සංස්ථාවට ඇතිවිට (නීතිමය හා ගිවිසුම්ගත) ප්‍රතිපාදන හඳුනාගනී. වගකීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුලත් වන සම්පත් පිටතට ගලා යෑමේ සම්භාවිතාවන් ඇතිවිට වගකීම් පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ හැක.

ආරම්භයේදී ප්‍රතිපාදන හඳුනාගනු ලබන්නේ වාර්තා කරන දිනට වගකීම් පියවීමට ප්‍රමාණවත් ලෙස අවශ්‍ය යැයි හැඟෙන මුදල් ප්‍රතිපාදන මඟිනි.

ප්‍රතිපාදන සඳහා විශාල අයිතම ප්‍රමාණයක් ඇතිවිට, ප්‍රමාණවත් ප්‍රතිපාදනයන් බොහෝ දුරට වියහැකි අගයන් වනු ඇත.

වර්තමාන අගයේ වටිනාකම ප්‍රමාණවත් වනවිට වර්තමාන අගයෙහි වෙළඳපොල තක්සේරුව සහ අවදානම් විශේෂතා පිළිබිඹු කරන පූර්ව බදු අනුපාතයක් භාවිතා කරමින් වගකීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරන මුදලේ වර්තමාන ප්‍රතිපාදන ඇති කරනු ලැබේ.

පසුව හඳුනාගැනීමේ කටයුතු සඳහා ආරම්භයේදී හඳුනාගත් වියදම් ප්‍රතිපාදන සඳහා ප්‍රතිපාදන ඇති කරනු ලැබේ.

මූල්‍ය නොවන වත්කම්

සමාගමේ මූල්‍ය නොවන වත්කම්, බඩු තොග සහ විලම්බිත බදු වත්කම්වල ගෙනයන අගයෙහි හානි පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වාර්තා කරන දිනයේදී සමාලෝචනය කෙරේ. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, වත්කම් ආපසු ලබාගත හැකි මුදල ඇස්තමේන්තු කර ඇත.

දේපල යන්ත්‍ර සහ උපකරණ

සංස්ථාව විසින් වසරකට වඩා "දේපල පිරියත සහ උපකරණ" පිළිබඳ LKAS 16 හි අවශ්‍යතා, සේවා සැපයීම සඳහා රඳවාගෙන සිටින සහ භාවිතා කරන, වෙනත් හෝ පරිපාලන කටයුතු සඳහා කුලියට ගැනීම සඳහා සහ තවත් බොහෝ දේ සඳහා භාවිතා කිරීමට අපේක්ෂා කරන තම වත්කම් සඳහා ගිණුම්කරණයේදී අදාළ වේ.

පිළිගැනීමේ පදනම.(මූලික හඳුනාගැනීම)

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ)
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇත්නම් දේපල පිරියත සහ උපකරණ හඳුනාගත හැකි අතර වත්කම්වල පිරිවැය විශ්වාශදායක ලෙස මැනිය හැකි විය යුතුය.

හඳුනාගැනීම

දේපල, පිරියත සහ උපකරණ අයිතම හඳුනා ගනු ලබන්නේ පිරිවැයෙන් (ඉඩම සම්බන්ධයෙන් සාධාරණ වටිනාකමින්) සමුච්ජිත ක්ෂය හා පාඩු තිබේ නම් අඩු කිරීමෙනි.

ක්ෂය වීම

වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව පිළිබිඹු කරන බැවින් දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ජීවිත කාලය මත සරල රේකිය පදනම මත ආදායම් ප්‍රකාශයේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත. කල්බදු කාලසීමාව අවසන් වන විට ලංකා ධීවර සංස්ථාවෙහි හිමිකාරිත්වය ඇති බව සාධාරණ ලෙස විශ්වාස කළහොත් මිස මූල්‍ය කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාල සීමාව හෝ අපේක්ෂිත ආයු කාලය යන දෙකෙන් අඩු කාලය තුළ ක්ෂය වේ.

සංස්ථාවේ ස්ථාවර වත්කම්වලට අදාල ක්ෂය කිරීම් අනුපාතයන් පහත දක්වා ඇත.

	වසර ගණන	අනුපාතය (%)
ගොඩනැගිලි	50	2.00
පිරියත හා යන්ත්‍ර උපකරණ	10	10.00
මෝටර් වාහන	5	20.00
උපකරණ	10	10.00
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10	10.00
පරිඝණක උපාංග	4	25.00
දේශීයව සංවර්ධනය කරන ලද මෘදුකාංග	1	100.00

- අලෙවිසැල් ඉදිකිරීමේ පිරිවැය වසර 05ක් තුල ක්ෂය වේ.
- දේශීයව නිෂ්පාදනය කරන ලද පරිගණක මෘදුකාංග වසරක් පුරා ක්ෂය වේ, එය මිලදී ගත් වර්ෂයේ ලාභ සහ අලාභ ගිණුමට 100%ක් අය කෙරේ.
- ප්‍රදානයක් ලෙස ලැබෙන වත්කම් ක්ෂයවීම් අනුපාතයට අනුකූලව ක්ෂය වෙමින් පවතී.

<u>ජංගම එදිරිව ජංගම නොවන වර්ගීකරණය</u>

සමූහය ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත මූල්‍ය තත්ත්වය ප්‍රකාශය තුළ වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරයි. වත්කමක් ජංගම ලෙස නම්:

- සාමාන්‍ය ක්‍රියාකාරී චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කෙරේ
- මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වනු ලැබේ.
- වාර්තා කරන කාලයෙන් පසු මාස 12ක් ඇතුලත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

  හෝ
- වාර්තා කිරීමේ කාලසීමාවෙන් පසු අවම වශයෙන් මාස 12ක් සඳහා වගකීමක් හුවමාරු කිරීම හෝ භාවිතා කිරීම සීමා නොකළහොත් මුදල් හෝ මුදල් සමාන වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ)
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

- අනිකුත් සියළුම වත්කම් ජංගම නොවන ලෙස වර්ග කර ඇත.
- වගකීම් ජංගම වන්නේ
- එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ නිරාකරණය කිරීමට බලාපොරොත්තු වේ.
- එය මූලික වශයෙන් වෙළඳාමේ අරමුණ සඳහා පවත්වනු ලැබේ.
- එය වාර්තා කාලසීමාවෙන් පසු මාස 12ක් ඇතුලත පියවීමට නියමිතය.

  හෝ

- වාර්තා කිරීමේ කාල සීමාවෙන් පසු අවම වශයෙන් මාස 12ක් සඳහා වගකීම් පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැත.

සමූහය අනිකුත් සියළුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.

කල්දැමූ බදු වත්කම් සහ වගකීම් ජංගම නොවන වත්කම් සහ වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

අයිති වත්කම්

දේපල, පිරියත සහ උපකරණවල පිරිවැයට වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් ඇතුළත් වේ. එවැනි වියදම්වලට දේපල, කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය සහ කර්මාන්තශාලා සහ උපකරණවල පිළිගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් දිගුකාලීන ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ණය ගැනීමේ පිරිවැය ඇතුළත් වේ. ස්වයං-සාදන ලද වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය සහ සෘජු ශ්‍රමය, වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වෙනත් ඕනෑම පිරිවැයක් සහ අයිතම කඩා බිද දැමීමට , සහ ඉවත් කිරීමට සහ ඒවා ඇති වැඩබිම් ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත.

දේපල, පිරියත සහ උපකරණවල සැලකිය යුතු කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වූ විට, ආයතනය පිළිවෙලින් නිශ්චිත ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ක්ෂයවීම් සහිත තනි වත්කම් (ප්‍රධාන සංරචක) වැනි කොටස් හඳුනා ගනී. එසේම, ප්‍රධාන පරීක්ෂණයක් සිදු කරන විට, පිළිගැනීමේ නිර්ණායක තෘප්තිමත් වන්නේ නම්, එහි පිරිවැය ප්‍රතිස්ථාපනයක් ලෙස යන්ත්‍ර සහ උපකරණ රැගෙන යන අගය ප්‍රමාණයෙන් හඳුනා ගැනේ. අනෙකුත් සියලුම අළුත්වැඩියා සහ නඩත්තු වියදම් ලාභ හා අලාභ ප්‍රකාශය තුළ හඳුනාගනී . ප්‍රතිපාදන සඳහා පිළිගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම්, වත්කම භාවිතා කිරීමෙන් පසු එය ඉවත් කිරීම සඳහා අපේක්ෂිත පිරිවැයේ වර්තමාන වටිනාකම අදාළ වත්කම්වල පිරිවැයට ඇතුළත් වේ.

නොනිමි වැඩ ප්‍රථමයෙන් භාවිතා කරන අවස්ථාවේදී හෝ වත්කම පැවරූ අවස්ථාවේදී අදාළ ප්‍රාග්ධන වත්කම් ගිණුම් වෙත මාරු කරනු ලැබේ.

ණය ගැනීමේ පිරිවැය

සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගත වනවිට ණය ගැනීමේ පිරිවැය වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කෙරේ.

ප්‍රාග්ධනීකරණය නොකරන ලද ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාව තුල වියදම් ලෙස හඳුනාගෙන ලාභ හෝ අලාභ ප්‍රකාශයට අය කෙරේ.

ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැයේ ප්‍රමාණයන් LKAS 23 - ණය ගැනීමේ පිරිවැයට අනුකූලව තීරණය වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ක්ෂේත්‍ර සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නා විශේෂිත ණය සම්බන්ධයෙන් දරන ලද ණය ගැනීමේ පිරිවැය අදාළ නොමේරූ වගාවේ පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත. බෝග වාණිජ අස්වැන්න සඳහා සූදානම් වන විට ප්‍රාග්ධනීකරණය නතර වේ.

එසේ ප්‍රාග්ධනීකරණය කරන ලද මුදල සහ ප්‍රාග්ධනීකරණ අනුපාත මූල්‍ය ප්‍රකාශනවල සටහන්වල අනාවරණය කර ඇත.

ආයෝජන දේපල

සින්නක්කර සහ කල්බදු දේපල ඇතුළු ආයෝජන දේපල යනු කුලී ආදායමක් ඉපැයීමට හෝ ප්‍රාග්ධන අගය කිරීම සඳහා හෝ දෙකම සඳහා පවතින දේපල වේ. ආයෝජන දේපල පිරිවැය මත ගිණුම් තබා ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්තියේ විස්තර කර ඇති පරිදි ආයෝජන දේපලවලින් ලැබෙන කුලී ආදායම ගිණුම්ගත කෙරේ

බාහිර, ස්වාධීන දේපල තක්සේරුකරුවෙකු, සුදුසු පිළිගත් වෘත්තීය සුදුසුකමක් සහ වටිනාකමක් ඇති දේපලවල පිහිටීම සහ කාණ්ඩය පිළිබඳ මෑතකාලීන අත්දැකීම් ඇති, වසර පහකට වරක් තක්සේරුව සිදු කිරීම සඳහා කුලියට ගනු ලැබේ._මෙම දේපල තක්සේරු කිරීම් සඳහා වර්ධක සහ/හෝ අඩු කිරීම් ලාභ හෝ අලාභ වශයෙන් හඳුනා ගැනේ.

ප්‍රධාන වැඩිදියුණු කිරීම්, ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කරන ලද ආයෝජන දේපල අයිතමයක අංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනීකරණය කර ඇත. අනෙකුත් පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය ආයෝජන දේපල අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් ලාභ හෝ අලාභ ගිණුමට ලියාහරිනු ලැබේ.

බඩු තොග

බඩු තොග වෙළඳ තොග සහ සාමාන්‍ය තොග ලෙස ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය. වෙළඳ තොග ලෙස මාළු, වියළි මාළු සහ අයිස් තොග ඇතුළත් වන අතර එය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු ම අගය මත තක්සේරු කල හැක .

ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත විකුණුම් මිල වන අතර, සම්පූර්ණ කිරීමේ සහ විකිණීමේ වියදම් සහ වෙළඳ නොවන තොග සඳහා ඇස්තමේන්තුගත පිරිවැය අඩුකළ පසු අගයයි

තොග පිරිවැය ගණනය කරනු ලබන්නේ WAC මුලධර්මය මත වන අතර තොග අත්පත් කර ගැනීම හා ඒවා එම ස්ථානයට ගෙන ඒම සහ එම තත්වයට පත් කර ගැනීමේ වියදම් ඇතුලත් වේ.

මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ බැංකුවේ මුදල් සහ අතේ ඇති මුදල් වලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි සහ සංස්ථාවේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ අත්පිට මුදල් කොටස්වල අංගයක් ලෙස ඇතුළත් වේ.

කොටස් ප්‍රාග්ධනය

කොටස්

ප්‍රාග්ධනය යනු සංස්ථාපිතය ආරම්භයේ සිටම සංස්ථා මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා රජය විසින් දායක වූ අරමුදල් ප්‍රමාණයයි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ) 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සංචිත

සංචිතය ආරම්භයේ සිට ලැබෙන සංචිත ශේෂයෙන් මුදල සමන්විත වන අතර, සංචිතය සැපයීමට හේතුවක් හෝ සංචිතය ප්‍රයෝජනයට ගන්නා ආකාරය පිළිබඳ කිසිදු ඇඟවීමක් නොමැත.

විකුණුම් ,වෙනත් ගෙවිය යුතු ගෙවීම් සහ ප්‍රතිපාදන / වෙන්කිරීම්

විකුණුම් සහ ගෙවිය යුතු අනෙකුත් දෑ පොලී දරන්නේ නැති අතර පිරිවැයට දක්වා ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලබන අතර, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය වනු ඇත. බලපෑම ද්‍රව්‍යමය නම්, විධිවිධාන තීරණය කරනු ලබන්නේ මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් සහ, සුදුසු අවස්ථාවලදී, වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන පූර්ව බදු අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙනි.

ප්‍රාග්ධන නොනිමි වැඩ

ප්‍රාග්ධන නොනිමි වැඩ ද්‍රව්‍යවල සමුච්චිත පිරිවැය සහ වත්කමක් ඉදිකිරීමට සෘජුවම සම්බන්ධ අනෙකුත් පිරිවැය නියෝජනය කරයි.

ප්‍රාග්ධන නොනිමි වැඩ, වත්කම ප්‍රථමයෙන් භාවිතා කරන අවස්ථාවේදී අදාළ වත්කම් ගිණුම් වෙත මාරු කරනු ලැබේ.

රජයේ ප්‍රදාන

ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇති තැන සහ අමුණා ඇති සියලුම කොන්දේසි වලට අනුකූල වේනම් රජයේ ප්‍රදාන හඳුනාගනු ලැබේ . ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විට, එය දැරීමට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ප්‍රදානය ගැලපීමට අවශ්‍ය කාල සීමාව තුළ ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට, විලම්බිත ආදායමක් ලෙස හඳුනාගෙන අදාළ වත්කමේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලයට සමාන ප්‍රමාණවලින් ආදායමට ලියා හරිනු ලැබේ.

සංස්ථාවට මූල්‍ය නොවන ප්‍රදාන ලැබෙන විට, වත්කම් සහ ප්‍රදානය නාමික ප්‍රමාණවලින් දළ වශයෙන් සටහන් කර සමාන වාර්ෂික වාරිකවලින් වත්කම්වල ප්‍රතිලාභ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ පරිභෝජන රටාව මත ආදායම් ප්‍රකාශය වෙත ලයා හරිනු ලැබේ. වත්මන් අදාළ වෙළඳපොළ අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් සමඟ රජය හෝ අදාළ ආයතන විසින් ණය හෝ ඒ හා සමාන ආධාර සපයන විට, මෙම සහන පොලි අනුපාතයේ බලපෑම අතිරේක රජයේ ප්‍රදානයක් ලෙස සැලකේ.

වන වගාව සඳහා ලැබෙන ප්‍රදාන හැර දේපල, පිරියත සහ උපකරණවලට අදාළ ප්‍රදාන මුලින් විලම්බිත කර අදාළ දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමානුකූල පදනමක් මත ආදායමට අය කරනු ලැබේ: වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත හෝ කල් ඉකුත් නොවූ කල්බදු දෙකෙන් අඩු අගය මත ක්‍රමක්ෂ කරනු ලැබේ.

ආදායම් හඳුනාගැනීම

ආදායම් හඳුනාගත යුත්තේ සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ සම්භාවිතාවක් ඇති වන විට වන අතර, ගෙවීම සිදු කරන්නේ කවදාද යන්න නොසලකා ආදායම විශ්වාසදායක ලෙස හඳුනාගත හැකිවිය යුතුය . බදු

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ)
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

හෝ නීරුබදු හැර ගිවිසුම්ගතව අර්ථ දක්වා ඇති ගෙවීමේ කොන්දේසි සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය යුතු සාධාරණ වටිනාකමකින් ආදායම මනිනු ලැබේ.

ආදායම හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත පිළිගැනීමේ නිර්නයකද සපුරාලිය යුතුය:

(අ) භාණ්ඩ විකිණීම

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබන්නේ භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරු වෙත ලැබුණු විටය.

(ආ) පොලී ආදායම

පොලී ආදායම සුළු පොලී ක්‍රමය මත හඳුනා ගැනේ.

(ඇ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් සත්‍ය පදනම මත හඳුනාගෙන ඇත.

විදේශ මුදල් ගනුදෙනු

විදේශ මුදල් වල ගණුදෙණු මුලින් වාර්තා කරනු ලබන්නේ ගණුදෙණුවේ දිනයේ ක්‍රියාකාරී මුදල් අනුපාතිකයේනි . විදේශ මුදල් වලින් නම් කර ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ විනිමය අනුපාතයට නැවත පරිවර්තනය කෙරේ. විදේශ මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැය අනුව මනිනු ලබන මූල්‍ය නොවන අයිතම මුල් ගණුදෙණුවල දිනයන්හිදී විනිමය අනුපාත භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගණනය කෙරේ.

අවිනිශ්චිත වත්කම් සහ වගකීම්

මෙමගින් කිසිදා සාක්ෂාත් කරගත නොහැකි ආදායමක් හඳුනාගැනීමේ ප්‍රතිඵලයක් විය හැකි බැවින් අවිනිශ්චිත වත්කම් සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශයේ හඳුනාගෙන නොමැත.
අවිනිශ්චිත වගකීම යනු අවිනිශ්චිත අනාගත සිදුවීමක ප්‍රතිඵලය මත සිදුවිය හැකි විභව වගකීමකි. වගකීම් ප්‍රමාණය සාධාරණ ලෙස තක්සේරු කළ හැකි නම් අනපේක්ෂිත වගකීමක් ගිණුම් වාර්තාවල සටහන් කළ හැක. කෙසේ වෙතත්, CFC නෛතික අංශය කිසිදු ඇස්තමේන්තුවක් ලබා නොදීම නිසා අවිනිශ්චිත වගකීමක් ලබා දී නොමැත.

දායකත්ව සැලැස්ම නිර්වචනය කිරීම

ලංකා ධීවර සංස්ථාව සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගේ වැටුපෙන් 15%ක් සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙළින් 3%ක් දායක වේ. මෙම ව්‍යවස්ථාපිත වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

වෙනත් හෙළිදරව් කිරීම්

අතිරික්ත කාර්ය මණ්ඩලය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමට කැබිනට් මණ්ඩලය ගත් තීරණයට අනුව සංස්ථාව විසින් ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇති අතර රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) මගින් සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට තවදුරටත් උපදෙස් දෙනු ලැබේ.

නව ගිණුම්කරණ ප්‍රමිති නිකුත් කර ඇති නමුත් තවමත් බලාත්මක නැත

ගිණුම්කරණ ප්‍රතිපත්ති (මූල්‍ය ප්‍රකාශනයේ)
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද පහත සඳහන් SLFRS, කලින් සම්මත කර නොගන්නේ නම්, 2016 ජනවාරි 1 වන දිනෙන් ආරම්භ වන මූල්‍ය වර්ෂයක් සඳහා බලපැවැත්වෙන්නේ නැත.

(අ) 2014 දී නිකුත් කරන ලද SLFRS 9, LKAS 39 - මූල්‍ය උපකරණ: හඳුනා ගැනීම සහ මැනීම ප්‍රතිස්ථාපනය කරයි. SLFRS 9 හි මූල්‍ය වත්කම්වල හානිය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය අලාභ ආකෘතියක් ඇතුළුව මූල්‍ය උපකරණ වර්ගීකරණය සහ මැනීම පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ සහ නව සාමාන්‍ය හෙජ් ගිණුම්කරණ අවශ්‍යතා ඇතුළත් වේ. එය LKAS 39 වෙතින් මූල්‍ය උපකරණ හඳුනා ගැනීම සහ හඳුනා නොගැනීම පිළිබඳ මාර්ගෝපදේශය ද ඉදිරියට ගෙන යයි.

SLFRS 9 2018 ජනවාරි 01 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලාත්මක වේ.

(ආ) SLFRS 15 ආදායම හඳුනා ගන්නේද, කොපමණ ප්‍රමාණයක් සහ කවදාද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපිත කරයි. නව ගුණාත්මක හා ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීමේ අවශ්‍යතා මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට පාරිභෝගිකයන් සමඟ ගිවිසුම් වලින් පැන නගින ආදායමේ සහ මුදල් ප්‍රවාහයේ ස්වභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිත බව අවබෝධ කර ගැනීමට හැකි වේ.

SLFRS 15 මඟින් ආදායම හඳුනා ගත යුත්තේ කවදාද සහ කුමන ප්‍රමාණයකින්ද යන්න තීරණය කිරීම සඳහා පියවර පහත ආකෘතියක් හඳුන්වා දෙයි. ආයතනයක් හිමිවීමට අපේක්ෂා කරන මුදලට භාණ්ඩ හා සේවා පාලනය පාරිභෝගිකයෙකුට පැවරීමේදී හෝ ආයතනයක් ලෙස හඳුනාගත් ආදායම බව ආකෘතිය සඳහන් කළේය.

එය දැනට පවතින ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශය ප්‍රතිස්ථාපනය කරයි, LKAS 18 මත "ආදායම" , LKAS 11 මත"ඉදිකිරීම් කොන්ත්රාත්".

SLFRS 15 2018 ජනවාරි 01 වැනි දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලාත්මක වේ.

අනුපාත විශ්ලේෂණය

	2017	2016	2015	2014	2013	2012	2011
ජංගම අනුපාතය	442,641,622.00	353,147,228.00	358,068,208.00	543,097,889.00	488,531,057.00	434,550,735.93	460,371,620.06
	857,123,433.00	495,366,134.00	773,392,616.00	728,141,127.00	768,654,822.00	661,261,994.96	536,446,231.13
	0.52 :1	0.71 :1	0.46 :1	0.75 :1	0.64 :1	0.66 :1	0.86 :1
ක්ෂණික වත්කම් අනුපාත	385,326,850.00	320,764,774.00	302,475,213.00	433,208,648.00	405,310,021.00	331,140,489.47	351,107,455.10
	857,123,433.00	495,366,134.00	773,392,616.00	728,141,127.00	768,654,822.00	661,261,994.96	536,446,231.13
	0.45 : 1	0.65 : 1	0.39 : 1	0.59 : 1	0.53 : 1	0.50 :1	0.65 :1
ශුද්ධ ලාභ අනුපාතය	(2,207,477.00)	247,828,937.00 x 100	(259,917,474.00) x 100	(119,187,719.00) x 100	(54,446,218.00) x 100	(41,763,563) x 100	(68,969,869) x 100
	2,127,438,604.00	2,735,721,733.00	2,479,196,333.00	2,822,779,492.00	1,969,485,805.00	2,078,840,744	1,977,444,527
	(0.10) %	9.06 %	(10.48) %	(4.22) %	(2.76) %	(2.01) %	(3.49) %

අපේ මානව සම්පත්

	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017
සමස්ථ සේවක සංඛ්‍යාව	763	718	652	1038	1315	1325	1275	1228	1120	754	712
විධායක නිලධාරීන් (පුහුණුවන්නන්ද ඇතුළුව)	66	58	49	58	80	78	76	68	66	43	42
ලිපිකරු හා කාර්මික	301	290	289	210	756	751	733	695	641	432	349
සුළු සේවකයින්	396	370	314	770	479	496	466	465	413	279	321